# ජාතික පොලිස් කොමිෂන් සභාව: කාර්යභාරය සහ පැමිණිලි විමර්ශන පිළිබඳ අධ්‍යයනය

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# ජාතික පොලිස් කොමිෂන් සභාව: කාර්යභාරය සහ පැමිණිලි විමර්ශන පිළිබඳ අධ්‍යයනය

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

2023 මැයි

***දායකත්වය***

රචනය
සමුදු බස්නායක

සංස්කරණය
අජිත් පැරකුම් ජයසිංහ

ප්‍රකාශනය
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

මුද්‍රණය
ඇඩ්ආර්ට්ස් - මහරගම

ව්‍යාපෘති කළමනාකරණය
දිනිති සුපේක්ෂලා

# පටුන


| | |
|---|---|
| **පෙරවදන** | 5 |
| **හැඳින්වීම** | 7 |
| **අධ්‍යයනයේ අරමුණු** | 8 |
| **අධ්‍යයනයේ සීමාවන්** | 8 |
| **අධ්‍යයන ක්‍රමවේදය** | 8 |
| **1. පසුබිම** | 7 |
| **2. ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යභාරය** | 11 |
| 2.1 නිලධාරීන් පත් කිරීම | 12 |
| 2.2 පළාත් පොලිස් කොමිෂන් සභාවල අධ්‍යක්ෂකවරුන් පත් කිරීම | 13 |
| 2.3 සංයුතිය | 14 |
| 2.4 මහජනතාව විසින් පොලිස් කොමිෂන් සභාවට කළ හැකි පැමිණිලි | 14 |
| 2.5 පොලිස් නිලධාරීන්ට ඉදිරිපත් කළ හැකි පැමිණිලි | 16 |
| 2.6 1960 ක්ෂණික ඇමතුම් සේවය | 16 |
| 2.7 පැමිණිලි සඳහා ලබා දෙන ප්‍රතිකර්ම | 17 |
| 2.8 පොලිස් කොමිෂන් සභාවට බලපෑම් කළ නොහැකි බව | 17 |
| 2.9 පොලිස්පතිවරයාගේ මැදිහත්වීම | 17 |
| 2.10 පාර්ලිමේන්තුවට වගකිව යුතු බව | 18 |
| **3. 2002 වර්ෂයේ සිට වත්මන් පොලිස් කොමිෂන් සභාව වන තෙක් පැවති ජාතික පොලිස් කොමිෂන් සභාවන් පිළිබඳ හැඳින්වීම** | 19 |
| **4. පොලිස් කොමිෂන් සභාව වෙත එල්ල වූ අභියෝග** | 22 |
| 4.1 පොලිස් කොමිෂන් සභාව වෙත එල්ල වූ දේශපාලන බලපෑම් | 22 |
| 4.2 පොලිස් කොමිෂන් සභාවේ අභ්‍යන්තර ගැටලු | 22 |

**5. පොලිස් කොමිෂන් සභාවක් පිහිටුවීමේ පසුබිම සහ එහි ක්‍රියාකාරීත්වය - නීතීඥ බැසිල් ප්‍රනාන්දු** 25

**6. පොලිස් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි පිළිබඳව විශ්ලේෂණය** 27

6.1 පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා ඇසුරෙන් විශ්ලේෂණය 27

6.2 2022 මැයි මාසයේ සිට 2023 පෙබරවාරි මස දක්වා මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මඟින් පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය 32

**නිර්දේශ** 36

# පෙරවදන

රටක පවතින රාජකාරි අතරින් රටේ පැවත්මටත්, එරට ජීවත්වන පුරවැසියන්ගේ පැවැත්මටත් ඉතා අවශ්‍ය, වගකීමකින් යුතු සේවාවක් සපයන ආයතනයක් ලෙස පොලීසිය හැඳින්විය හැක. රාජ්‍යයේ ආරක්ෂාව මෙන්ම එහි වෙසෙන මහජනතාවගේ ජීවිත හා දේපල ආරක්ෂාකර දීමත්, එම රාජ්‍ය අපරාධ හා දූෂණයන්ගෙන් තොරව විධිමත්ව හා සාමකාමීව පවත්වාගෙන යාම ඇතුළු සැලකිය යුතු වගකීම් රාශියක් පැවරී ඇත්තේ පොලිසිය වෙතය.

ඉහත වගකීම් නිසි ලෙස සම්පූර්ණ කිරීමට හැකි පොලීසියක් පවතින රටවල් සමාජ හා ආර්ථික වශයෙන් විශාල ලෙස දියුණුවක් ලබා ගෙන තිබේ. අප උන් හිටි තැන් විකුණා හෝ ජීවිතය පරදුවට තබා විවිධ නීති විරෝධී ක්‍රමයන් ඔස්සේ හෝ යන්නට හදන්නේ එසේ දියුණු වූ රටවල් වෙතය. මෙම රටවල් සංවර්ධනය වූ රටවල් ලෙස ද හැඳින්වේ.

පොලීසිය තම රාජකාරිය නිසි ලෙස ඉටු කිරීමට අපහොසත් වන්නේ නම් ඒ රටට කිසිදා දියුණුවක් ලබා ගැනීමට නොහැකි වනු ඇත. එමෙන්ම, එම රට අපරාධ හා දූෂණ, අක්‍රමිකතා වලින් පිරුණු, නීතිය මත පාලනයක් සිදු නොවන, පාරේ නඩු අහන රාජ්‍යයක් බවට අනිවාර්යෙන් පත්වනු ඇත.

මෙවැනි පසුබිමක් තුළ දීර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ පොලීසියේ වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳව විශාල සංවාදයක් මේ වන විට නිර්මාණය වී තිබේ. පොලීසියේ සමහර නිලධාරීන් තම නිල බලය පාවිච්චි කරමින් අපරාධ හා දූෂණවලට සම්බන්ධව කටයුතු කිරීමත්, විවිධ නමගිය අපරාධකරුවන් සමග සමහර නිලධාරීන් විශේෂ සම්බන්ධතා තිබෙන බව හෙළිවීමත්, සැකකරුවන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා තවමත් යල්පැන ගිය කෲර හිංසා ක්‍රමයන් භාවිතා කිරීමත්, අහිංසක මිනිසුන් හට බොරු නඩු පැවරීමත්, අවම බලය වෙනුවට අයුතු බලය යෙදවීමත් මෙම සංවාදයේ මූලික මාතෘකා ලෙස සඳහන් කළ හැක.

මත්ද්‍රව්‍ය මර්දනය සඳහා පිහිටුවා ඇති පොලිස් නාකොටික් අංශයේ සැලකිය යුතු නිලධාරීන් පිරිසක් ලංකාවේ මත්ද්‍රව්‍ය ජාවාරමට සෘජු ලෙසම සම්බන්ධ බවට පසුගියා දා හෙළිවීමත් සමග අප වැටී ඇති ප්‍රපාතයේ තරම මැනවින් පැහැදිලි විය.

පොලිස් සේවය ස්වාධීන, අපක්ෂපාතී හා කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීම සදහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් වූ 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව පිහිටුවන ලදී. ඉහත අරමුණුවලට අමතරව පොලිස් සේවා සම්බන්ධව මහජන පැමිණිලි විමර්ශනය, පොලිස් නිලධාරීන්ගේ පැමිණිලි විමර්ශනය මෙන්ම, පොලිස්පතිවරයා හැර අනෙකුත් සියලුම පොලිස් නිලධාරීන් බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම් හා විනය ක්‍රියා මාර්ග සිදු කිරීමේ බලය මෙම කොමිෂන් සභාව වෙත පැවරී තිබුණි.

2002 වසරේ දී ආරම්භ වූ මෙහි පළමු කොමිෂන් සභාව විසින් පොලිස් සේවාව දේශපාලන බලපෑම් වලින් තොරව ස්වාධීනව කටයුතු කරන ආයතනයක් බවට පත්කිරීමට අවශ්‍ය මුල් පියවර ගනිමින් මහජනතාවගේ ගෞරවයට පාත්‍ර වන ගුණාත්මක පොලිස් සේවාවක් ඇති කිරීම සදහා සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී.

නමුත් 2005 වසරේ දී පත් වූ නව ආණ්ඩුව විසින් ගෙන එන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව ඇතුළු ස්වාධීන කොමිෂන් සභාවන්හි බල රහිත කරන ලදී. එමෙන්ම, අදාළ කොමිෂන් සභා සදහා තමන්ට හිතවත් පුද්ගලයින් පත්කරමින් වසර 10කට ආසන්න කාලයක් මෙම කොමිෂන් සභා බොඩ් ලෑලි බවට පත් කර තිබුණි.

කෙසේ හෝ 2015 දී බලයට පත් වූ යහපාලන රජය විසින් ගෙන එන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවතත් මෙම කොමිෂන් සභා සක්‍රිය කිරීමට උත්සාහ ගන්නා ලදී.

ඒ අනුව 2015 වසරේ දී පත්වූ හතරවන පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස් සේවය ස්වාධීන හා කාර්යක්ෂම කිරීම සඳහා පොලිස් සේවයට බඳවා ගැනීම, උසස් කිරීම් හා මාරුකිරීම සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස් කළ අතර, පොලිස් නිලධාරීන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් ද හඳුන්වා දෙන ලදී. නමුත් 2019 වසරේ දී බලයට පත් වූ නව රජය විසින් හඳුන්වා දුන් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම කොමිෂන් සභාවන්හි බලය නැවත විධායකය වෙත පවරා ගන්නා ලදී.

මේ ආකාරයෙන් දිගින් දිගටම පොලිස් සේවාව කඩාකප්පල් කිරීම නිසා, අද ශ්‍රී ලංකාවේ ඇති දූෂිතම ආයතන කිහිපය අතරට පොලිසිය පත්ව තිබේ. මේ හේතුවෙන් අපරාධ, අල්ලස් හා දූෂණයෙන් පිරී ගිය සමාජයක් අපට හිමිකර දී තිබේ. රටක් වශයෙන් අප බංකොලොත් රාජ්‍යයක් දක්වා ඇද වැටීමට මේ පොලිස් සේවාවේ කඩා වැටීම ද බලපා තිබේ.

ඒ නිසා රට දියුණු කිරීමට නම් පොලිස් සේවය ස්වාධීන හා කාර්යක්ෂම සේවාවක් බවට පත්කර ගැනීමට සියලු පුරවැසියන් මැදිහත් විය යුතුය. පොලීසියට නවීන තාක්ෂණය එකතු කිරීම, අපරාධ හා දූෂණයන් පිළිබඳව පරීක්ෂණ සඳහා දියුණු රටවල් භාවිතා කරන නවීන විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වා දීම, අලුත් දැනුම පොලිස් පද්ධතියට ගෙන ඒම, චර්යාධර්ම මත ක්‍රියාත්මක ආචාරශීලී, සුහද සේවාවක් පොලීසියට අනිවාර්ය කිරීම, පොලිස් නිලධාරීන් මුහුණ දෙන ගැටලු විසඳා ගැනීම සඳහා ස්ථිර ක්‍රමවේදයන් සැකසීම, නිලධාරීන් ඇගයීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම සිදු කළ යුතුය.

මෙම කටයුත්තේ මූලික වගකීමක් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරී තිබේ.  දශක දෙකකට ආසන්න කාලයක් ජාතික පොලිස් කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වුවත්, ඉන් අප ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කළ යුතුය. ඒ අරමුණෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව පිළිබඳව අපගේ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහාත්, ජාතික පොලිස් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහාත් මෙම වාර්තාව සකස් කිරීමට අප තීරණය කළෙමු.

මේ හරහා පොලීසිය, ජාතික පොලිස් කොමිෂන් සභාව, මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හා එහි කටයුතු කරන මානව හිමිකම් ආරක්ෂකයින් අතර මනා අවබෝධයක් හා සම්බන්ධතාවයක් ඇති කර ගැනීමත්, පොලිස් සේවාව උසස් හා ශක්තිමත් තත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය මහජන සහයෝගය ලබා ගැනීමත්, මේ සම්බන්ධව රාජ්‍ය පර්ශ්වයන් සමග උද්දේශනය සිදු කිරීමත් අප මෙමගින් බලාපොරොත්තු වේ.

මෙම ප්‍රකාශනය සැකසීම සඳහා විවිධ අයුරින් දායක වූ දිනිති සුපේක්ෂලා, රශ්මිකා විජේසිංහ, සුරංජන් ප්‍රසාද්, සුනෙත් ගජනායක හා මෙම වාර්තාව රචනා කළ සමුදු බස්නායකට ස්තූති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂක,
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

20/06/2023

# හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ 1990 දශකයේ මුල් භාගයේ සිට නීතිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවය සැපයීම, අල්ලස සහ දූෂණය වැළැක්වීම වැනි පුළුල් මහජන අවශ්‍යතා ඇති වැදගත් ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන ජාතික කොමිෂන් සභා පිහිටුවීමට මහජන ඉල්ලීමක් තිබුණි. 1990 අංක 1 දරණ පොලිස් කොමිෂන් සභා පනත මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාවක් සහ එක් එක් පළාත් සභා සඳහා පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ අනුෂංගික හෝ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීමට ක්‍රියා කළ ද 17 වන සංශෝධනය මඟින් එම පනත බල රහිත වී එම සංශෝධනය හරහා අධීක්ෂණ ආයතන ස්ථාපිත විය. ඒ අනුව පොලිස් කොමිෂන් සභාවේ ආරම්භයත් සමඟ පොලිසිය නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරන, ජනතාවට වගකීම්සහගත සේවාවක් සපයන ජනතා හිතවාදී ආයතනයක් වේ යැයි ජනතාව අපේක්ෂා කළහ.

2002 වසරේදී පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වූයේ පොලිස් සේවයට සිදු කරන මැදිහත්වීම් හෝ අනිසි බලපෑම්වලින් තොරව ස්වාධීනත්වය තහවුරු කිරීම, රාජකාරිය අපක්ෂපාතීව සහ නිර්භයව ඉටු කිරීමට හැකි පරිසරයක් ගොඩනැගීම සහ පොලිස් සේවයේ සියලුම තරාතිරම්වල සිටින නිලධාරීන් තුළ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ගෞරවය ඇති කිරීමය. මේ වන විට එහි අරමුණු වෙනත් මානයකට විතැන් වී ඇති බව කිව මනාය.

කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත බලතල සහ කාර්යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාවේ දක්වා ඇත. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. (2) ව්‍යවස්ථාව මඟින් පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට එරෙහිව ඕනෑම අගතියට පත් පුද්ගලයෙකු කරන ලද 'මහජන පැමිණිලි' සලකා බැලීම, විමර්ශනය කිරීම සහ නීතියෙන් සපයා ඇති පරිදි සහන සැලසීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමට විධිවිධාන සලසා ඇත. එබැවින් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදු කරන මෙම මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ක්‍රියාවලියේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවක් බව පෙනී ගියේය. එම අවශ්‍යතාවය මූලික කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි.

මෙහිදී මූලික වශයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ආරම්භය සහ විකාශනය, සංයුතිය, මහජන පැමිණිලි අංශයේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාවය පිළිබඳව අවධානය යොමු කර ඇත. මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා දිස්ත්‍රික්ක හයක් පුරා විහිදී ඇති මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා ජාතික පොලිස් කොමිෂන් සභාවට යොමු කළ පැමිණිලි ද අධ්‍යයනය කර ඇති අතර එම තොරතුරු විශ්ලේෂණය කරමින් අධ්‍යයනය අවසානයේදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි අංශයේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර ඇත.

# අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයන වාර්තාවේ ප්‍රධාන අරමුණ වූයේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි අංශයේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂමතාවය පවතින්නේ කිනම් තත්වයක ද යන්න විමසා බැලීමය. මීට අමතරව ජාතික පොලිස් කොමිෂන් සභාවට යොමු වන පැමිණිලි විමර්ශනය වන යාන්ත්‍රණය සහ එහි ඇති අඩුලුහුඩුකම් පිළිබඳවද මෙම අධ්‍යයන වාර්තාව තුළ සාකච්ඡාවට බඳුන් කර ඇත.

# අධ්‍යයනයේ සීමාවන්

මෙම අධ්‍යයන වාර්තාව හරහා අවධානය යොමු කර ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි අංශයේ ක්‍රියාකාරීත්වය දෙස පමණි. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පොලිස් නිලධාරීන්ට ඉදිරිපත් කළ හැකි පැමිණිලි පිළිබඳව මෙම අධ්‍යයනය තුළ සඳහන් නොවේ.

තවද, අධ්‍යයනය සිදු කිරීමේදී මුහුණ දුන් ප්‍රධාන ගැටලුවක් වන්නේ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානයන් හරහා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කළ ඇතැම් පැමිණිලිකරුවන් සහ ප්‍රථමාධාර මධ්‍යස්ථානවල සම්බන්ධීකාරකවරුන්/වරියන් අතර පැවති සම්බන්ධතාව ගිලිහී යාම නිසාවෙන් තොරතුරු ලබාගැනීමේ අපහසුතාවක් පැන නැගීමයි.

# අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී යොදා ගනු ලැබූ ක්‍රමවේදය වූයේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂමතාවය සහ ස්වාධීනත්වය පිළිබඳ එක් රැස් කරගන්නා ලද තොරතුරු, මාධ්‍ය වාර්තා, පුවත්පත් ලිපි, ග්‍රන්ථ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලීම් ඉදිරිපත් කර ලබාගන්නා ලද තොරතුරු, ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාවන් සහ සම්මුඛ සාකච්ඡා හරහා ලබා ගන්නා ලද තොරතුරු ඒකරාශී කර ඒවා පුළුල් වාර්තාවක් තුළ සංශ්ලේෂණය කර ඉන් අනතුරුව විශ්ලේෂණය කිරීමයි.

එහිදී  සම්මුඛ සාකච්ඡා සහ ගම්පහ, මාතර හා දෙනියාය, ගාල්ල, කුරුණෑගල, ත්‍රිකුණාමලය, සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් පුරා විහිදී ඇති මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා 2022 මැයි මස සිට 2023 පෙබරවාරි මස දක්වා ජාතික පොලිස් කොමිෂන් සභාවට යොමු කළ පැමිණිලි ප්‍රාථමික දත්ත වශයෙන් මෙම අධ්‍යයනයට මූලිකවම පදනම් කොටගෙන ඇත. එමෙන්ම මෙම අධ්‍යයන වාර්තාව සඳහා තොරතුරු එක්රැස් කිරීමේ දී මාධ්‍ය වාර්තා, පුවත්පත් ලිපි, ග්‍රන්ථ සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තා මඟින් ලබාගත් ද්විතීයික දත්ත මත විශ්වාසය තැබීය.

# 1. පසුබිම

ආරක්ෂාව ජනතාවගේ අයිතියකි. පොලිසිය යනු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සාමය ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම, මහජනතාවගේ ස්ථාවරත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය විසින් පිහිටුවන ලද මූලික යාන්ත්‍රණයයි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා පොලිසිය බලය භාවිතා කරයි. බලය භාවිතා කිරීමේදී, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ පොලිසිය සුවිශේෂී සහ සූක්ෂම ස්ථානයක තබයි. එම නිසා පොලිසියට සෑම විටම මහජන අවශ්‍යතා සඳහා බලය භාවිත කිරීම සහ අපක්ෂපාතීව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් පාලන යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යභාරය වන්නේ පොලිස් සේවයේ නියැලී සිටින පුද්ගලයින්ගේ හැසිරීම අධීක්ෂණය කිරීම සහ පොලිසිය මහජනතාවට වගවීම සහතික කිරීමය. වගවීමේ ක්‍රියාවලිය පොලිසියේ සහ පොලිස් සේවයේ සඵලතාවය ඇගයීමට පහසුකම් සපයයි. පොලිස් නිලධාරීන්ද ඔවුන්ගේ උපරිම හැකියාවෙන් ක්‍රියා කරමින්, රජය කෙරෙහි විශ්වාසය ඇති කරමින් සහ මහජනතාවට ප්‍රතිචාර දක්වමින්, ඔවුන් සේවය කිරීමට අදහස් කරන බව සහතික කරයි.

මෙහිදී අවධානය යොමු කළ යුතු ප්‍රජාතාන්ත්‍රීය පොලිස්කරණය යනුවෙන් අදහස් කරන්නේ මානව හිමිකම් සහ මහජන අවශ්‍යතා කෙරෙහි ප්‍රමුඛතාවක් දක්වමින් කටයුතු කිරීමයි. 1990 දශකයේ මුල් භාගයේ සිට නීතිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවය සැපයීමල අල්ලස සහ දූෂණය වැළැක්වීම වැනි පුළුල් මහජන අවශ්‍යතා ඇති වැදගත් ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන ජාතික කොමිෂන් සභා පිහිටුවීමට මහජන ඉල්ලීමක් තිබුණි. ජාතික පොලිස් කොමිෂන් සභාවක්සහ එක් එක් පළාත් සභා සඳහා පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස 1990 අංක 1 දරන පොලිස් කොමිෂන් සභා පනත ගෙන ආ නමුත් 17 වන සංශෝධනය මඟින් මෙම පනත බල රහිත වී එම සංශෝධනය හරහා අධීක්ෂණ ආයතන ස්ථාපිත කරන ලදී. එබැවින් පොලිසිය නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරන, ජනතාවට වගකියන සේවාවක් සහිත ජනතා හිතවාදී ආයතනයක් බවට පත්වේවි යැයි ජනතාව අපේක්ෂා කළහ.

ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීමේ මූලික අවශ්‍යතාවන් වූයේ ආයතන දේශපාලනීකරණයෙන් ඉවත් කිරීම, නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම සහ රට තුළ යහපාලනය ඇති කිරීමය. ඉන් එකක් වන ජාතික පොලිස් කොමිෂන් සභාව 2002 නොවැම්බර් මස පිහිටුවන ලදී. එහි ප්‍රධාන අරමුණ වූයේ පොලිස් සේවයට සිදු කරන මැදිහත්වීම් හෝ අනිසි බලපෑම්වලින් තොරව ස්වාධීනත්වය තහවුරු කිරීම, රාජකාරිය අපක්ෂපාතීව සහ නිර්භයව ඉටු කිරීමට හැකි පරිසරයක් ගොඩනැගීම සහ පොලිස් සේවයේ සියලුම තරාතිරම්වල සිටින නිලධාරීන් තුළ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ගෞරවය ඇති කිරීමය. පොලිස් නිලධාරීන් කළමනාකරණය කිරීම සහ පොලිසියට එරෙහි පැමිණිලි විමර්ශනය කිරීමේ සියලු බලතල කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

17 වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව 2003 සිට 2005 දක්වා වසර තුනක කාලයක් පොලිස් කටයුතු සම්බන්ධයෙන් වගවීම සහතික කරන ඵලදායී අධීක්ෂණ ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට සමත් විය. විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර ඇති වූ ව්‍යවස්ථාමය අර්බුදයක් හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව විධායක ජනාධිපතිවරයා විසින් සාමාජිකයින් පත් කරන ලද නාමික මණ්ඩලයක් ලෙස පිහිටුවන ලදී. එපමණක් නොව, 1980-2009 දශක තුනක සිවිල් ගැටුම් හේතුවෙන් රටේ දකුණේ සහ ඊසානදිග ප්‍රදේශ දෙකෙහිම පරිපාලන හා මූල්‍ය සම්පත් පරිහරණය සම්බන්ධයෙන් පවා පොලිසියේ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම තවදුරටත් දුර්වල විය. 2010 වසරේ 18 වැනි සංශෝධනය ක්‍රියාත්මක කිරීමත් සමඟ පොලිසිය සිරස් අධීක්ෂණයකට ලක්ව තිබුණේ නැත. කොමිෂන් සභාවේ අධීක්ෂණ කටයුතු ඉතා සීමිත වූ අතර පොලිසියට එරෙහි මහජන පැමිණිලි ලැබීමට පමණක් සීමා වී, විමර්ශනය කර වාර්තාව පසු

විපරම් කිරීම සඳහා පොලිස්පතිවරයාට භාරදීම සිදු විය. පොලිස්පතිවරයාගේ ක්‍රියාව නිරීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට බලයක් තිබුණේ නැත.

19 වැනි සංශෝධනය යටතේ හතරවැනි කොමිෂන් සභාව 1980 - 2009 දශක තුනක සිවිල් ගැටුම් හේතුවෙන් රටේ දකුණේ සහ උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පොලිසිය ප්‍රජාවට සේවය කරන ක්‍රමයක් වෙනුවට වඩ වඩාත් මිලිටරිකරණය වූ පද්ධතියක් බවට පත් විය.  මේ හේතුව නිසාවෙන්, මෙම කාල සීමාව තුළ සහ සිවිල් ගැටුමෙන් පසුව 2009 සිට පවා හමුදාව සහ පොලිසිය අතර වැඩි වෙනසක් මහජනතාවගෙන් බහුතරයක් දැන සිටියේ නැත. 2009 සිවිල් යුද්ධය අවසන් වීමත් සමඟ රට පෙරට වඩා සාමකාමී විය.  කෙසේ වෙතත්, පොලිස් සේවය නවීන සමාජයක පරමාර්ථය වන ප්‍රජා පොලිස් සංස්කෘතියට පරිවර්තනය වීමට ඉවහල් වන පරිදි එහි මිලිටරි ස්වභාවයෙන් මිදීමට අපොහොසත් විය.[1]

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එතෙක් ව්‍යවස්ථාදායක සභාව මගින් ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයන් පත් කිරීමේ බලය ජනාධිපති යටතට පත් කෙරිණි. මෙමගින් ජාතික පොලිස් කොමිෂන් සභාව සම්බන්ධයෙන් අසීමිත බලයක් ජනාධිපතිවරයාට ලබා දුන්නා සේම ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට මෙන්ම පොලිස් සේවයේ ස්වාධීනත්වයට ද එයින් අහිතකර ලෙස බලපෑම් එල්ල විය.[2]

ඉන්පසු 21 වැනි සංශෝධනය හරහා ජනාධිපතිවරයා සතු තනි බලය යම් අධීක්ෂණයකින් හා සුපරීක්ෂාකාරීව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාවක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කරමින් නැවතත් ස්වාධීන කොමිෂන් සභා බලාත්මක විය. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම ද ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව  කළ යුතුව ඇත.

1. Wiki, E. B. &. (2020, August 9). National Police Commission (Sri Lanka) - EverybodyWiki Bios & Wiki. EverybodyWiki Bios & Wiki.
2. https://www.cpalanka.org/wp-content/uploads/2020/09/Sinhala-Summary-of-20th-Amendment-Proposal.pdf

# 2. ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යභාරය

කොමිෂන් සභාවේ කාර්යභාර්ය වන්නේ පොලිස්පතිවරයා සමඟ සාකච්ඡා කර, (අ) අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ඕනෑම ප්‍රතිපත්තියකට යටත්ව, බඳවා ගැනීම්, උසස්වීම් සහ ස්ථාන මාරුවීම් යෝජනා ක්‍රම සැකසීම ඇතුළුව, පොලිස් නිලධාරීන් සම්බන්ධ සියලු කරුණු තීරණය කිරීම; (ආ) පුහුණු කිරීම සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම; (ඇ) ජාතික කොට්ඨාසයේ සහ පළාත් කොට්ඨාසවල භාවිතය සඳහා අවශ්‍ය ආයුධ, පතොරම් සහ අනෙකුත් උපකරණවල ස්වභාවය සහ වර්ගය කවරේද යන්න නිර්ණය කිරීම; සහ (ඈ) චර්යා සංග්‍රහ සහ විනය පටිපාටි සකස් කිරීමය.

වර්තමාන කොමිෂන් සභාව පොලිස් පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, නීතිය සහ නීතිමය ක්‍රියා පටිපාටිය, සමාජය සහ මානව හැසිරීම් සහ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අත්දැකීම් ඇති සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. එය මහජනතාවගේ යහපත සඳහා පොලිස් සේවය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සමබර තීරණ ගැනීමට පහසුකම් සපයන විශේෂඥ දැනුමේ සම්මිශ්‍රණයකි. 18 වැනි සංශෝධනය යටතේ පිහිටුවන ලද හිටපු කොමිෂන් සභාවට එහි පැවැත්මේ වසර හයක කාලයක් තුළ එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රමාණවත් බලතල හෝ අවශ්‍ය මානව සහ වෙනත් සම්පත් නොතිබුණි. කෙසේ වෙතත් නව කොමිෂන් සභාවට පුළුල් බලතල පැවරී ඇත.

කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත බලතල සහ කාර්යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාවේ දක්වා ඇත. වගන්තිය 155උ (1) (අ) අනුව පොලිස්පතිවරයා හැර අනෙකුත් පොලිස් නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇත. කොමිෂන් සභාව එවැනි බලතල ක්‍රියාත්මක කරන්නේ පොලිස්පතිවරයා සමඟ සාකච්ඡා කරමිනි. 155උ (1) (ආ) වගන්තියට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 අ පරිච්ඡේදය යටතේ එවැනි කොමිෂන් සභා පිහිටුවන විට සහ පළාත් පොලිස් සේවා කොමිෂන් සභා වෙත පැවරී ඇති බලතල සහ කාර්යයන් කොමිෂන් සභාව විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී අවමානයට ලක් නොකළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ (2) ව්‍යවස්ථාව මඟින් පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට එරෙහිව ඕනෑම අගතියට පත් පුද්ගලයෙකු කරන ලද මහජන පැමිණිලි සලකා බැලීම, විමර්ශනය කිරීම සහ නීතියෙන් සපයා ඇති පරිදි සහන සැලසීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සලසා ඇත. කොමිෂන් සභාව සහන සැලසීමේදී, වහාම පොලිස්පතිවරයාට දැනුම් දිය යුතුය.[3]

ජාතික පොලිස් කොමිෂන් සභාවේ අරමුණු සහ දැක්ම පිළිබඳව අවධානය යොමු කළහොත්, අරමුණු තුනක් හමු වෙයි. එනම්,[4]

1. පොලිස් සේවාවේ මානව සම්පත් ඵලදායී ලෙසත්, කාර්යක්‍ෂම ලෙසත්, කළමණාකරණය කිරීම තුළින් ගුණාත්මක ප්‍රතිපත්ති සහ යහපත් පරිචයන් ක්‍රියාවට නංවමින් වෘත්තීයමය වශයෙන් උසස් සහ තෘප්තිමත් පොලිස් සේවයක් ඇති කිරීම.

2. කිසිදු නොමනා අගතියකින් හෝ අනුග්‍රහයකින් මෙන්ම වෙනස් කොට සැලකීමකින් තොරව මානව අභිමානය සහ නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව පොලිසියට එරෙහිව ඇති මහජන පැමිණිලි වේගවත්ව විමර්ශනය කිරීම මගින් මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දැක්වීම සහ වගවීම.

---

3. https://www.parliament.lk/files/pdf/constitution-si.pdf
4. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). › ,xldfõ iajdëk rdcH fldñIka iNd( b;sydih" n,;," l%shdldÍ;ajh iy iajNdjh [Sinhala]. PAFFREL.

3. මානව සුරක්ෂිතතාව ඇති කිරීම සහ අපරාධ වැළැක්වීම අවධාරණය කරමින්, වෙනත් පාර්ශවකරුවන් සමඟ සමීප සහයෝගීතාවයකින් යුක්තව විවිධ පියවර් සැලසුම් කරමින් සහ ක්‍රියාවට නංවමින් පොලිස් සේවයේ කාර්යක්ෂමතාව සහ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සාකල්‍යමය ප්‍රවේශයක් අනුගමනය කිරීම.

පොලිස් කොමිෂන් සභාවේ දැක්ම බවට පත් වී ඇත්තේ, විශ්වසනීය වූත්, ස්වාධීන වූත්, වෘත්තීයමය පොලිස් සේවාවක් තුළින් සුරක්ෂිත, නිරුපද්‍රිත සහ සාමකාමී සමාජයක් බිහි කිරීම යන කාරණාවන් ය. ඊට අමතරව මානව අයිතිවාසිකම්වලට ගරු කරන සහ සුරකින, මහජන වගවීම සහතික කරන, නීතියේ ආධිපත්‍ය දිරිගන්වන, කාර්යක්ෂම, පාරදෘශ්‍ය සහ මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දක්වන සේවාවක් ලෙසට ශ්‍රී ලංකා පොලිසිය පරිණාමනය කිරීම පොලිස් කොමිෂන් සභාවේ මෙහෙවර බවට පත් වී ඇත.

## 2.1 නිලධාරීන් පත් කිරීම


ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ නම් නිර්දේශ කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 1 ව්‍යවස්ථාව සහ 41ආ ව්‍යවස්ථාවන් අනුව මෙම කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කිරීම ජනාධිපතිවරයා විසින් සිදුකළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මතය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ. (4) අනුව සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින 14 ක් ඇතුලත ජනාධිපති විසින් මෙම පත් කිරීම සිදු කළ යුතුය. ජනාධිපති එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පහළොස් වන දින සිට එකී නිර්දේශිත පුද්ගලයන් සාමාජිකයන් ලෙස විධිමත්ව පත්වූවා සේ සලකන බව ද එකී ව්‍යවස්ථාවේ තවදුරටත් සඳහන් වේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස සුදුසු සාමාජිකයන් තිදෙනෙකුගේ නම් ආණ්ඩුකම ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපතිට ප්‍රමුඛතා අනුපිළිවෙළක් සහිතව නිර්දේශ කළ යුතු අතර එම සාමාජිකයන් අතරින් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කළ යුතුය. ජනාධිපති විසින් දින 14 තුළ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපති වෙත නිර්දේශිත නම් අතරින් පළමුවට නම් සඳහන් සාමාජිකයා සභාපති ලෙස පත් වන බවට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ සඳහන් වේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතබව ආරක්ෂාකාරී වීමට උපකාරී වන තවත් විධිවිධාන දෙකක් වේ. කොමිෂන් සභාවේ සාමාජිකයින් වීමේ සුදුසුකම් දක්වා තිබීම ඉන් එකකි, ඒ යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාවට පත් කරන සාමාජිකයන් අතරින් යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙකුවත් නියෝජ්‍ය පොලිස්පතිවරයකු වශයෙන් හෝ ඊට ඉහළ ධුරයක් දැරූ විශ්‍රාමලත් පොලිස් නිලධාරියෙකු විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ (1) ව්‍යවස්ථාවේ දක්වා ඇත.

දෙවැන්න වන්නේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට නුසුදුස්සකු වන ආකාරයයි. යම් තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වුවහොත් හෝ ඒ තැනැත්තා කොමිෂන් සභාව සාමාජිකයකු ලෙස පත් කිරීම හෝ එසේ සාමාජිකයන් ලෙස තවදුරටත් කටයුතු කර ගෙන යාම හෝ නොකළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ (2) ව්‍යවස්ථාවේ දක්වා ඇත.[5]

5. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL.




*මූලාශ්‍රය - ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය 2020*

## 2.2 පළාත් පොලිස් කොමිෂන් සභාවල අධ්‍යක්ෂකවරුන් පත් කිරීම

17 වන ව්‍යවස්ථා සංශෝධන යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 අ පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවීමට හැකියාවක් ඇත.[6]

එසේ පිහිටුවන පළාත් කොමිෂන් සභාවල අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම වන්නේ පළාත් මට්ටමින් මහජන පැමිණිලි භාරගෙන විමර්ශන කටයුතු ස්වාධීනවත් අපක්ෂපාතීවත් කර අසාධාරණට පත්වී ඇති ජනතාවට සහන සැලසීමයි. මහජන පැමිණිලි විමර්ශන ක්‍රමවේදය පූර්ණ වෙනසකට භාජනය කර ඇති අතර පළාත් මට්ටමින් පැමිණිලි භාරගැනීමට එක් පළාතකට එක් කාර්යාලය බැගින් පිහිටුවා ඇත. රාජ්‍ය සේවයේ සහ පොලිස් සේවයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතුරින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර එකී සේවාවන්වල හසල අත්දැකීම් ඇති විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් පළාත් අධ්‍යක්ෂවරුන් ලෙස තෝරා ගන්නා අතර පොලිස් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන ක්‍රියාවලිය පිළිබඳව දින තුනක වැඩමුළුවක් තෝරාගත් පළාත් අධ්‍යක්ෂවරුන් සඳහා පවත්වනු ලැබේ.

2021 නොවැම්බර් මස වන විට පළාත් අධ්‍යක්ෂකවරුන් 10 දෙනෙක් පත් කර ඇත. බස්නාහිර පළාතේ මහජන පැමිණිලි ප්‍රමාණය සලකා බලා එම පළාත සඳහා පළාත් අධ්‍යක්ෂවරුන් දෙදෙනකුට පත් වීම් ලබා දී තිබුණි.[7]

6. 17 වන ව්‍යවස්ථා සංශෝධනය
7. https://www.dinamina.lk/2021/11/11/

## 2.3 සංයුතිය

ජාතික පොලිස් කොමිෂන් සභාවට නිශ්චිතවම එක් සමාජිකයෙකු ලෙස නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හෝ ඊට ඉහළ නිලධාරියෙකු පත් කළ යුතු වීම සාධනීය කරුණකි. මන්ද ශ්‍රී ලංකා පොලිසිය පිළිබඳව අත්දැකීම් සහිත අවබෝධයක් හා දැනුමක් ඇති අයෙකු කොමිෂන් සභාවේ සිටීම අනෙකුත් සාමාජිකයන්ටත් එහි කටයුතුවලටත් පහසුවක් වන නිසාය. එසේම අනෙකුත් සාමාජිකයන් හය දෙනා නිශ්චිත නොකිරීම තුළ විවිධ ක්ෂේත්‍රවල දැනුමැති විශේෂඥයන් පත්කර ගැනීමේ ඉඩක් නිර්මාණය වී තිබීම ඉතා වැදගත්ය.

නමුත් පොලිස් කොමිෂන් සභාවට නැංවුණු චෝදනාවක් වූයේ එහි හිටපු පොලිස් නිලධාරීන්ගේ ප්‍රමාණය වැඩි වීම තුළ එය තවත් පොලීසියක් බවට පත්වී ඇති බවය. වත්මන් කථානායකගේ අදහස් ද එකී මතය සමග යම් තරමකට සමීපතාවක් පෙන්නුම් කළේය. එනම්, ඔවුන් හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරුන් මිස සක්‍රිය සේවයේ නියුතු අය නොවන බව තමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ලෙස එම පොලිස් නිලධාරීන්ට මතක් කර දුන් බව කථානායක විසින් ප්‍රකාශ කිරීම ඊට සාක්ෂියකි. එසේම, පොලිස් සේවයේ යම් යම් මාරු කිරීම් සම්බන්ධව කොමිෂන් සභා සාමාජිකයින් සෘජුවම මැදිහත් වූ බවට පැමිණිලි ලැබී තිබූ බවද ඔහු අනාවරණය කළේය. කොමිෂන් සභාවේ අනිසි මැදිහත්වීම් සිදු වූ බවක් මින් ගම්‍යමාන වන බව කිව යුතුය.

කොමිෂන් සභාවේ සංයුතිය සම්බන්ධයෙන් ආ එක් විවේචනයක් වූයේ එහි ක්‍රියාකාරී මට්ටම දුර්වල වීමට සාමාජිකයන් වයස්ගත අය වීම හේතුවක් වී ඇති බවය. විවිධ ක්ෂේත්‍රවලින් පැමිණි ඒ අය අතර සාමූහිකත්වයක් ගොඩනැගීම අපහසු විය. ඒ දුර්වලතාව පොලිස්පති සහ ඉහළ නිලධාරීන් විසින් පොලිස් කොමිෂන් සභාව ගණන් නොගැනීමට ද හේතුවක් වූ බව විවේචනය තුළ අඩංගු වී තිබිණි.[8]

## 2.4 මහජනතාව විසින් පොලිස් කොමිෂන් සභාවට කළ හැකි පැමිණිලි

මූලික වශයෙන් පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට විරුද්ධව මහජනයාට පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කළ හැකි අවස්ථා දෙකක් ඇත. ඒ අනුව අගතියට පත් වූ අයකුට තමන් අගතියට පත් වුණ ආකාරය පිළිබඳව පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කිරීම සහ අගතියට පත් වූ අයකු වෙනුවෙන් ක්‍රියා කරන්නකු හෝ අගතියට පත් වූවකු වෙනුවෙන් ක්‍රියා කරන සංවිධානයකට ද පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කළ හැකිය.

එහිදී පොලිස් කොමිෂන් සභාව විසින් මූලිකව බාර ගනු ලබන්නේ, පොලිස් නිලධාරීන් විසින් නිල තත්ත්වයෙන් කරන විවිධ අසාධාරණකම් සහ අනීතික ක්‍රියා පිළිබඳව වූ පැමිණිලි ය. මහජන පැමිණිලි භාර ගැනීම සහ විමර්ශනය කිරීම සඳහා මහජන පැමිණිලි විමර්ශන අංශයක් අධ්‍යක්ෂවරයෙකුගේ මූලිකත්වයෙන් පිහිටුවා තිබෙන අතර ඊට අමතරව පළාතකට එක බැගින් පළාත් අධ්‍යක්ෂවරු නව දෙනෙකු පත්කර ඇත. මෙම ක්‍රියාවලියට සහාය වීම සඳහා එක් එක් පළාත් කාර්යාල සඳහා විමර්ශන නිලධාරියකුත් අනුයුක්ත කර තිබේ. පෞද්ගලිකව කොමිෂන් සභාවට පැමිණීමෙන් හෝ ලිඛිත පැමිණිලි හෝ ඊමේල් මගින් මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. විමර්ශනය අවසන් කිරීමෙන් පසු පොලිස් ස්ථාන භාර නිලධාරීන් සහ සහකාර පොලිස් අධිකාරී නිලයේ සිට ඉහළ නිලයන්හි නිලධාරීන් සම්බන්ධයෙන් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලය හා ඉන් පහළ නිලයන්හි නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස්පතිවරයා මගින් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ. තවද යම් අපරාධ වරදකට වරදකරුවන් වන නිලධාරීන්ට අධිකරණයේ ක්‍රියාමාර්ග ගැනීමටද පොලිස්පති වෙත නිර්දේශ ලබාදෙනු ලැබේ. මෙයට අමතරව කෲර වධහිංසාවලට ජනතාව ලක්කිරීම පිළිබඳව විමර්ශනයට පිහිටුවා තිබූ කොමිෂන් සභා විශේෂ විමර්ශන ඒකකය පොලිස් පරීක්ෂකවරයෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ පිහිටුවා ඇත.

පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස් නිලධාරීන්ට එරෙහිව භාර ගනු ලබන පැමිණිලි වර්ග 25ක් ඉතා පැහැදිලිව සහ සෘජුව ප්‍රකාශයට පත් කර ඇත. එම පැමිණිලි වර්ග 25හ කරුණු වශයෙන් පහත නම් කර දක්වා ඇත.[9]

8. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL
9. N. (2018, January 10). ජාතික පොලිස් කොමිෂන් සභාව ඔබ වෙනුවෙනි Roar සිංහල https://roar.media/sinhala/main/srilanka-life/national-police-commission

1. මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ ක්‍රියා.

2. පොලිස් රැකවරණයේ/ අත්අඩංගුවේ සිටියදී සහ පොලිස් නිලධාරියෙකුගේ කිසියම් ක්‍රියාවක් මගින් මහජනයාගෙන් කෙනෙකුට වධ හිංසා පැමිණවීම සහ හෝ කෲර අමානුෂික හෝ අවමන් ලෙස සැලකීම සහ තුවාල සිදු කිරීම පිළිබඳ චෝදනා.

3. පොලිස් රැකවරණයේ/ අත්අඩංගුවේ සිටියදී පුද්ගලයකු මරණයට පත් වීම.

4. පොලිස් නිලධාරියෙකු විසින් උසාවියට අසත්‍ය නඩු ඉදිරිපත් කිරීම සහ ව්‍යාජ වාර්තා හා ප්‍රකාශ ඉදිරිපත් කිරීම.

5. ජනමාධ්‍ය මගින් ස්වාධීන පරීක්ෂණයක් ඉල්ලා පුළුල් ප්‍රසිද්ධියක් ලබා දෙන මහජන අවධානය දිනා ගත් කිසියම් චෝදනාවක්.

6. පොලිස් නිලධාරීන් විසින් කරන ලද සංඥය වැරදි.

7. විමර්ශනයට ලක් කෙරන සිද්ධීන් හෝ විනය පරීක්ෂණ හෝ අධිකරණ නඩුවලදී ඔවුන් විසින්ම හෝ යොදාගත් අතරමැදියන් විසින් සෘජුවම අපරාධයට ලක්වූවන් හා සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් මැදිහත් වීම, ඔවුන් බිය ගැන්වීම හා ඔවුන්ට තර්ජනය කිරීම.

8. වෛද්‍ය නිලධාරියෙකු හෝ ඕනෑම රාජ්‍ය නිලධාරියෙකු අසත්‍ය වැරදි වාර්තා ඉදිරිපත් කිරීමට හෝ රාජකාරි පැහැර හැරීමට බලයෙන් නම්මවා ගැනීම හෝ බිය ගැන්වීම, සාක්ෂි හෝ වාර්තා විනාශ කිරීමට දරන ඕනෑම ප්‍රයත්නයක්.

9. බලය අනිසි ලෙස යෙදීම, රාජකාරි පැහැර හැරීම සහ රාජ්‍ය සේවයට අපකීර්තියක් ගෙන දෙන ක්‍රියා.

10. පොලිස් නිලධාරීන් විසින් වෙඩි තැබීමේ සිද්ධීන්.

11. නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම.

12. පැමිණිලි සටහන් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම.

13. පහර දීම බිය ගැන්වීම අපයෝජනය සහ තර්ජනය කිරීම.

14. ප්‍රශ්නයක් සටහන් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම/ අසමත් වීම / කල් දැමීම.

15. සටහන් කර ඇති ප්‍රකාශවල කරුණු හිතාමතා විකෘති කිරීම.

16. වාර්තා මකා දැමීම හෝ වෙනත් ආකාරයකින් වෙනස් කිරීම මගින් වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වීම.

17. රාජකාරි කටයුතු සිදු කිරීමේදී දේශපාලන පක්ෂවල සාමාජිකයන් වෙත පක්ෂපාතීත්වය දැක්වීම.

18. පොලිස් නිලධාරියකු විසින් සිදු කරන විෂමාචාරයක් හේතුවෙන් සාධාරණ යුක්තියක් ඉටු නොවීම.

19. පොලිස් නිලධාරියකු හෝ පොලිස් වාහනයක් සම්බන්ධ වන මාරක රිය අනතුරු.

20. පොලිස් සේවයේ දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන් කොට්ඨාස හා දිස්ත්‍රික්ක භාර නිලධාරීන් පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ සහ සාමාන්‍ය පොලිස් නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව.

21. චූදිත පුද්ගලයන්ට එරෙහිව දෝෂ සහගත හෝ අසම්පූර්ණ සාපරාධී චෝදනා සිතාමතා ඉදිරිපත් කිරීම.

22. සාමාන්‍ය ගාස්තු ගෙවීමෙන් පසු යම් පුද්ගලයකුට පොලිසියට කරන ලද ප්‍රකාශවල ලබා ගත හැකි සහතික කළ පිටපත් ලබා දීම අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම.

23. පැමිණිලිකරුවන් හෝ සාක්ෂිකරුවන් විසින් ප්‍රකාශයක් කරනු ලැබීම අධෛර්යමත් කිරීම.

24. පැමිණිලිකරුවන්ට හෝ සාක්ෂිකරුවන්ට අසභ්‍ය වචනයෙන් බැණ වැදීම තර්ජනය කිරීම හෝ බිය වැද්දීම.

25. කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පොලිසිය විසින් පක්ෂපාතීත්වය දැක්වීම සහ ක්‍රියා නොකිරීම.

මේ ආකාරයේ ක්‍රියාවන්ට එරෙහි පැමිණිලි ලිඛිතව සකස් කර පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයි.

## 2.5 පොලිස් නිලධාරීන්ට ඉදිරිපත් කළ හැකි පැමිණිලි

මීට අමතරව පොලිස් නිලධාරීන්ටද තමන්ට රාජකාරි කටයුතුවලදී ඉහළ නිලධාරීන්ගෙන් සිදුවූ අසාධාරණ ගැන පොලිස් කොමිෂන් සභාවට අභියාචනා කිරීමට හැකියාවක් ඇත. උසස්වීම්, ස්ථාන මාරුවීම්, විනය කරුණු, සේවයෙන් පහ කිරීමේ නියමයන් සම්බන්ධයෙන් වූ අභියාචනා පොලිස් කොමිෂන් සභාව විසින් භාරගන්නා අතර එම අභියාචනා පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා අමතා කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය. එම අභියාචනා ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ පොලිස් කොමිෂන් සභාවේ කාර්යාලයට භාරදී ලදු පතක් භාර ගැනීම කළ යුතු ය. විශේෂයෙන්ම අදාළ අභියාචනා මාස හයක් ඇතුළත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. මෙලෙස අභියාචනයක් යොමු කළ විට පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අභියාචනා මණ්ඩලයක් වෙත එය යොමු කරනු ලැබේ. බැලූ බැල්මට පෙනෙන දුක්ගැනවිල්ලක් අභියාචනයේ ඇතුළත් වේ නම් අභියාචන මණ්ඩලය විසින් ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත.

අභියාචන මණ්ඩලයේ තීරණය තුළ අදාළ දුක්ගැනවිල්ල සම්බන්ධ නිර්දේශිත සහන ඇතුළත් කිරීමට හැකියාවක් ඇත. මීට අමතරව උසස්වීමක්, ස්ථාන මාරුවක්, විනය පිළිබඳ කාරණයක්, සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් සහ විනය පිළිබඳ කාරණයකදී කොමිෂන් සභාව විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධාරියෙකුට ඊට විරුද්ධව අභියාචනයක් පරිපාලන අභියාචන විනිශ්චයාධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඇත.

කරන ලද අභියාචනයක් මත ලබා දී තිබෙන නියමයන් වෙනස් කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට සහ ඒ පරීක්ෂණයම තවදුරටත් පවත්වාගෙන යාමට හෝ වෙනත් පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට තිබේ. ඒ අනුව කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමේ බලය සහ සුළු වශයෙන් වෙනස් කිරීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය ඒ විනිශ්චයාධිකාරය සතුය. ජාතික පොලිස් කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු ආයතනයකි. එක් එක් වර්ෂයේ කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වූ වාර්තාවන් ඒ ඒ වර්ෂයේදී කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.[10]

## 2.6 1960 ක්ෂණික ඇමතුම් සේවය

පොලිස් සේවයේ කාර්යක්ෂමතාවය මනිනු ලබන්නේ මහජන පැමිණිලිවලට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම මගිනි. මෙම මිනුම්කරණය ලෝකයේ සැම රටකම පාහේ පිළිගත් සිද්ධාන්තයකි. පොලිස් දෙපාර්තමේන්තුවේ 119 ඇමතුම් සේවයට ලැබෙන පැමිණිලි ඉතා ඉහළ තත්ත්වයක පවතින අතර, ඇතැම් විටෙක මහජනතාවට එම සේවාව ලබාගැනීමට නොහැකි වන අවස්ථාද ඇත. එයට සමගාමීව ජාතික පොලිස් කොමිෂන් සභාවේ 1960 ක්ෂණික දුරකථන ඇමතුම් සේවය මහජන අවශ්‍යතාවන්ට සරිලන ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට හැකි සේවාවක් ලෙස හැඳින්වීමට හැකිය.

දිවයිනේ නන්දෙසින් පැය 24 පුරාම ශ්‍රී ලංකා පොලිසියට ලැබෙන පැමිණිලි ගණන අසාමාන්‍ය ලෙස ඉහළ යාම මත මනා සැලසුමක් සහිතව පැමිණිලි භාරගැනීමේ අවශ්‍යතාවක් ඇතිවිය. මෙම අවශ්‍යතාව හේතුකොට ගෙන විමර්ශන කටයුතු අප්‍රමාදව සිදුකිරීම සඳහා විසඳුමක් ලෙස 119 හදිසි ඇමතුම් සේවය ආරම්භ කරන ලදී.

10. N. (2018, January 10). ජාතික පොලිස් කොමිෂන් සභාව ඔබ වෙනුවෙනි - Roar සිංහල https://roar.media/sinhala/main/srilanka-life/national-police-commission

2004 වසරේ නොවැම්බර් 18 වන දින එවකට සිටි පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතාගේ සංකල්පයකට අනුව පොලිස් අණදෙන තොරතුරු කොට්ඨාසයෙහි 119 පොලිස් හදිසි ඇමතුම් අංශය ආරම්භ කර ඇත. 119 සේවය අනුව පොලිස් නිලධාරීන් විසින් පණිවිඩ, වර්ග තුනකින් ලබා ගැනීමට කටයුතු කරන අතර ඊට අදාළ ක්ෂණිකවම ප්‍රතිචාර දැක්වීමටද කටයුතු කරයි.

1. පණිවිඩයට ක්ෂණිකව ක්‍රියාත්මක වීම.
2. සිද්ධිය සිදුවී අවසන් වූ පැමිණිල්ලකට අදාළව ඉදිරි උපදෙස් ලබාදීම.
3. රහස්‍ය තොරතුරු සම්බන්ධයෙන්, විශේෂයෙන් නීති විරෝධී මත්පැන් වැනි ජාවාරම් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සහ ඊට අදාළව පැමිණිලි සටහන් කර ගැනීම.

මේ ආකාරයට ක්‍රියාත්මක වන 119/118 හදිසි ඇමතුම් උපකාරක සේවයෙහි යම් යම් අවස්ථාවන්හිදී ක්‍රියාත්මක නොවීම් වාර්තා වී ඇති අතර ඊට සමගාමීව ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් සේවයක් ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාවේ 1960 ක්ෂණික ඇමතුම් සේවය මේ වන විට ස්වාධීන මැදහත්කාරක සේවයක් ලෙස ජනතාව අතරට පැමිණ ඇත.[11]

## 2.7 පැමිණිලි සඳහා ලබා දෙන ප්‍රතිකර්ම

මේ ආකාරයට පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි කළ පසුව එම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පැමිණිලි විමර්ශනය භාර අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන අතර ඔහුගේ විමර්ශනයෙන් පසුව පහත සඳහන් ප්‍රතිකර්ම සුදුසු පරිදි ලබා දෙනු ඇත.[12]

1. අගතියට පත් වූ පාර්ශවය සම්බන්ධයෙන් නියමිත පරිදි රාජකාරි ඉටුකර දීමට මැදිහත් වීම.
2. විනය විරෝධී ක්‍රියා කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයාට යොමු කිරීම.
3. විනය විරෝධී ක්‍රියා කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කිරීම.

## 2.8 පොලිස් කොමිෂන් සභාවට බලපෑම් කළ නොහැකි බව

නීත්‍යනුකූල කාර්යය ඉටු කිරීමකදී හැර කොමිෂන් සභාවේ යම් තීරණයකට සෘජුව හෝ වක්‍රව කවර හෝ පුද්ගලයකුට බලපෑම් කිරීමට සහ බාධා කිරීමට හැකියාවක් නොමැත. එසේ කළහොත් ඕනෑම තැනැත්තකු වරදකරුවෙකු ලෙස සැලකේ. ඒ අනුව එලෙස වරදකරුවකු වූ තැනැත්තකුට රුපියල් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත වීමට සිදු වේ. එසේත් නොමැතිනම් අදාළ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත් වීමට සිදු වේ. එම නිසා කිසිම පුද්ගලයකු හට කොමිෂන් සභාවේ කටයුතුවලට, තීරණවලට කුමන හෝ ආකාරයකින් බලපෑම් කළ නොහැකිය. එය වරදකි. මීට අමතරව කොමිෂන් සභාව විසින් කරනු ලැබූ යම් නියමයක් හෝ ගනු ලැබූ තීන්දුවක් පරීක්ෂා කිරීමට ඒ ගැන ප්‍රශ්න කිරීමට අයිතිය ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයට සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය ට පමණි. කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකාරයකට ඒ සඳහා වූ අධිකරණ බලයක් නොමැත.[13]

## 2.9 පොලිස්පතිවරයාගේ මැදිහත්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ආ 5 ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ "පොලිස්පතිවරයාට අදාළ යම් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා යෝජිත යම් රැස්වීමක් හැර කොමිෂන් සභාවේ කවර වූ හෝ රැස්වීමකට පැමිණීමට සහභාගිවීමට ද පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය. එකී රැස්වීම්වලදී ඡන්දය භාවිතා කිරීමට ඔහුට

11. 2021 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව, ජාතික පොලිස් කොමිෂන් සභාව.
12. N. (2018, January 10). ජාතික පොලිස් කොමිෂන් සභාව ඔබ වෙනුවෙනි - Roar සිංහල https://roar.media/sinhala/main/srilanka-life/national-police-commission
13. N. (2018, January 10). ජාතික පොලිස් කොමිෂන් සභාව ඔබ වෙනුවෙනි - Roar සිංහල https://roar.media/sinhala/main/srilanka-life/national-police-commission

හිමිකම නොමැත්තේ ය'' යනුවෙනි. මේ අනුව කොමිෂන් සභාවේ කටයුතු සඳහා පොලිස්පතිවරයාගේ මැදිහත්වීම කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට තරමක බාධාකාරී වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඊ 1 ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ තමන්ගේ නීත්‍යානුකූල කාර්යය ඉටු කිරීමේ දී හැර, "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ මේ පරිච්ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් එසේ බලය පවරනු ලැබූ යම් පොලිස් නිලධරයකුගේ හෝ යම් තීරණයකට කෙළින්ම හෝ වක්‍රාකාරයෙන් තමා විසින්ම හෝ වෙනත් තැනැත්තෙකු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු සමග කවර වුවද ආකාරයකින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන හෝ අයුතු ලෙස මැදිහත් වන හෝ කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක සාමාජිකයෙකු වෙත හෝ එසේ බලය පවරන ලද යම් පොලිස් නිලධරයකු වෙත එසේ බලපෑම් කරන හෝ කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර ඔහු එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේය.[14] මේ අනුව කොමිෂන් සභාවට අනවශ්‍ය මැදිහත්වීම්වලින් තොරව කටයුතු කිරීමට නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

## 2.10 පාර්ලිමේන්තුවට වගකිව යුතු බව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 දැක්වෙන්නේ "බලතල කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම් සහ ඉටුකිරීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු වන අතර, එක් එක් ලිත් වර්ෂයේ කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් ඒ ඒ වර්ෂයේදී කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය" යනුවෙන් ය. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු ආයතනයකි.[15]

14. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL
15. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL.

# 3. 2002 වර්ෂයේ සිට වත්මන් පොලිස් කොමිෂන් සභාව වන තෙක් පැවති ජාතික පොලිස් කොමිෂන් සභාවන් පිළිබඳ හැඳින්වීම

මෙරටට අලුත්ම අත්දැකීමක් වූ ජාතික පොලිස් කොමිෂන් සභා ක්‍රමය පළමුවතාවට ස්ථාපිත වන්නේ 2001 වසරේ සිදු වුණු ආණ්ඩු පෙරළියත් සමඟිනි. ඡන්ද පොරොන්දුවක් ඉටු කරමින් එවකට අග්‍රාමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පිහිටුවූ ස්වාධීන කොමිෂන් සභා අතර ප්‍රමුඛතම කොමිෂන් සභාවක් වූයේ ජාතික පොලිස් කොමිෂන් සභාවය. 19න් බිහි වුණු වත්මන් පොලිස් කොමිෂන් සභාව තරම් බලතලවලින් එම කොමිෂන් සභාව ශක්තිමත් නැතත්, 2002 නොවැම්බරයේදී 17 වන සංශෝධනයෙන් බිහි කළ පළමු ජාතික පොලිස් කොමිෂන් සභාව, පොලීසිය යම් තරමකින් ස්වාධීන ආයතනයක් බවට පත් කරමින් දේශපාලන ග්‍රහණයෙන් එය මුදාගන්නට සමත් වූ බව නම් අදටත් බහුතරයකගේ මතය වී තිබේ.

ජාතික පොලිස් කොමිෂන් සභා පිහිටුවීම්[16]

| | කොමිෂන් සභාවේ කාල සීමාව | සභාපති සහ කොමසාරිස්වරු | කොමිෂන් සභාවේ විශේෂ ක්‍රියාමාර්ග (නිර්දේශ, මාර්ගෝපදේශ) | වෙනත් විශේෂ සටහන් |
|---|---|---|---|---|
| 1 | 2002 නොවැම්බර් මස සිට 2005 නොවැම්බර් මස දක්වා | ජනාධිපති නීතිඥ රංජිත් අබේසූරිය (සභාපති) | පොලීසිය දේශපාලනීකරණයෙන් මුදවාගැනීමට දැවැන්ත සේවයක් මෙම කාල සීමාව තුළ ඉටුවිය.<br><br>දේශපාලකයන්ගේ නියෝගවලට පොලිස් ස්ථානාධිපතිවරුන් පත්කිරීම සහ පොලිස් නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදය අඩාල විය. | ප්‍රථම පොලිස් කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු පැවති පළමු පළාත් පාලන මැතිවරණයේදී මැතිවරණ නීති උල්ලංඝනය කිරීම්සහ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සම්බන්ධ වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා අපේක්ෂකයන් ඇතුළු සියයකට වැඩි දේශපාලයකයන් පිරිසක් අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකියාව ලැබී ඇත. |

16. පොලිසියේ ප්‍රශ්න විසඳන පොලිස් කොමිෂමේ සභාපති ප්‍රශ්නය (2019, March 8). සිළුමිණ.

| | | | | |
|---|---|---|---|---|
| 2 | 2006 අප්‍රේල් මස සිට 2009 අප්‍රේල් මස දක්වා | නෙවිල් පියදිගම (සභාපති) | | දෙවන පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයාසහ  සෙසු සාමාජිකයන් පත් කරනු ලැබුවේ එවකට ජනාධිපතිවරයා වූ මහින්ද රාජපක්ෂ විසිනි.<br><br>2009 වසරේ අප්‍රේල් 9 දා දෙවන පොලිස් කොමිෂන් සභාවේ වසර තුනක සේවා කාලය අවසන් වනවාත් සමඟ එය 'නාමික කොමිෂන් සභාවක්' බවට පත් විය. එතැන් සිට බෝඩ් ලෑල්ලකට පමණක් සීමා වූ ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල සියල්ල පාහේ විතැන් වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටය. ඒ නැවතත් පොලීසියේ කොඳුනාරටිය බිඳදමමින් දේශපාලන තුණ්ඩු කෑල්ලට ස්ථානාධිපතිවරුන් පත් කරන යුගයක් අරඹමිනි. |
| 3 | 2012 පෙබරවාරි මස සිට 2015 අප්‍රේල් මස දක්වා | ජනාධිපති නීතිඥ සේනක වල්ගම්පාය (සභාපති) | | 17 සංශෝධනයෙන් පැවති බලතල සියල්ල පාහේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරමින් පොලිස් කොමිෂන් සභාවට ඉතිරි කෙරෙන්නේ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතල පමණි. පොලිසියට එරෙහි මහජන පැමිණිලි පමණක් මෙයින් විමර්ශනය විය. |
| 4 | 2015 ඔක්තෝබර් මස සිට 2018 ඔක්තෝබර් මස දක්වා | මහාචාර්ය සිරි හෙට්ටිගේ/නීතිඥ පී.එච්. මනතුංග (සභාපතිවරු) | පොලිස් සේවාවේ ගුණාත්මක වෙනසක් වෙනුවෙන් මෙම කොමිෂන් සභාව වැඩ කටයුතු කර ඇත. පොලිසියට ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීම ඒ අතර කැපීපෙනන කටයුත්තකි. උසස් කිරීම් සහ බඳවාගැනීම් සඳහා ප්‍රතිපත්තියක් පවා හඳුන්වා දෙනු ලැබිණි. | මහාචාර්ය සිරි හෙට්ටිගේ 2017 ජනවාරි 8 දා සභාපති ධූරයට සමු දෙන්නේ තවදුරටත් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස සේවයේ නිරත වන බව සඳහන් කරමිනි. ඒ අනුව හිස් වන සභාපති ධූරයට පත් කෙරෙන්නේ පී.එච්. මනතුංග මහතාවය. ඒ 2017 ජනවාරි 18 දාය. |

| | | | | |
|---|---|---|---|---|
| 5 | 2019 පෙබරවාරි සිට 2020 දෙසැම්බර් 03 දක්වා | මහාචාර්ය සිරි හෙට්ටිගේ (වැඩබලන සභාපති) | | පස්වන පොලිස් කොමිෂන් සභාවේ සභාපති ධුරය සම්බන්ධයෙන් අර්බුදයක් ගොඩනැඟිනි. ඒ මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා සභාපති ධුරයෙන් ඉවත් වූ පසු 2017 ජනවාරි 18 දා සිට මනතුංග මහතා සභාපති ධුරයට පත් කරමින් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නිකුත් කර ඇති ලිපියේ වසර තුනකට ඔහු සභාපති ධුරයට පත් කර ඇති බවට වූ සඳහනකි. අනාවරණය වන ආකාරයට එය තාක්ෂණික දෝෂයකි. පොලිස් කොමිෂන් සභාවේ සභාපති තමන් යැයි මනතුංග මහතා සදහන් කළ ද පස්වන කොමිෂන් සභාවේ සභාපති ධුරයට ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ වූයේ ඩී.ටී.පී. කොල්ලුරේ මහතාය.<br><br>මෙම අර්බුදය හමුවේ පස්වන කොමිෂන් සභාවේ සභාපති ධුරයට පත් කරනු ලැබූ ඩී.ටී.පී. කොල්ලුරේ මහතා තීරණය කරන්නේ සභාපති ධුරය අත්හරින්නටය. ඒ අනුව වැඩ බලන සභාපතිවරයා ලෙස මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා පත්විය. |
| 6 | 2020 දෙසැම්බර් 03 සිට 2023 මැයි 16 දක්වා | චන්ද්‍රා ප්‍රනාන්දු (සභාපති) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලැබූ 20 වන සංශෝධනය ප්‍රකාරව පාර්ලිමේන්තු සභාවේ එකඟතාවය ඇතිව හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති ලෙස චන්ද්‍රා ප්‍රනාන්දු මහතා පත් කරනු ලැබිණි. |
| 7 | 2023 මැයි 16 සිට | විශ්‍රාමික මහාධිකරණ විනිසුරු ලලිත් ඒකනායක (සභාපති) | | ජාතික පොලිස් කොමිසමේ නව සභාපති ලෙස විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ලලිත් ඒකනායක මහතා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පත්කරනු ලැබිණි. |

# 4. පොලිස් කොමිෂන් සභාව වෙත එල්ල වූ අභියෝග

## 4.1 පොලිස් කොමිෂන් සභාව වෙත එල්ල වූ දේශපාලන බලපෑම්

කොන්ත්‍රාත් පදනම මත ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් ධූරය දැරූ ආරියදාස කුරේ මහතා එම තනතුරෙන් ඉවත් කොට ඇත්තේ 2018 වර්ෂයේදී තෙල්දෙණිය හා දිගන ඇති වු ගැටුම් සම්බන්ධයෙන් පොලීසියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පොලිස්පතිගෙන් වාර්තාවක් ඉල්ලු නිසා බව කැෆේ සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කේන්ද්‍රය අවධාරණය කරමින් එකල ප්‍රකාශයක් කර තිබුණි. ජාතික පොලිස් කොමිෂන් සභාව තෙල්දෙණිය ගැටුම් පිළිබඳව ස්වාධීන විමර්ශනයක් සිදුකිරීමට උත්සහ දැරීම වළක්වා ගැනීමට දේශපාලන නායකත්වයේ බලපෑම මත ලේකම්වරයා ඉවත් කිරීම සිදුව ඇත.

පොලිස් අකාර්යක්ෂමතාව හේතුවෙන් තෙල්දෙණිය හා දිගන ගැටුම් උත්සන්න වූ බව මේ වන විට විවෘත රහසකි. කැෆේ සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කේන්ද්‍රය විසින් ගැටුමට පසුදින මේ පිළිබඳ අදහස් දැක්වූ අතර සිද්ධියේදී පොලිස් දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාව පිළිබඳ විමර්ශනයක් පවත්වන ලෙස පොලිස් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියේය. ලක්ෂ්මන් කිරිඇල්ල, රවුෆ් හකීම්, හලීම් යන අමාත්‍යවරුන් ද, පා.ම. දිළුම් අමුණුගම හා යුද හමුදාපතිවරයා ද පැවසුවේ පොලිස් අකාර්යක්ෂමතාව හේතුවෙන් ගැටුම් වර්ධනය වූ බවයි.

ප්‍රහාරය වර්ධනය වන තෙක් පොලීසිය එයට ඉඩ දී බලා සිටි බවට පොදු මතයක් රට තුළ පැවති අතර මේ පිළිබඳ පොලිස් කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් වී තිබුණි. අම්පාර හා තෙල්දෙණිය සිදුවීම් සම්බන්ධයෙන් එවකට අග්‍රාමාත්‍යවරයා ද පොලිසියට චෝදනා කර තිබුණි. පොලිස් කොමිෂන් සභාවේ ලේකම් ආරියදාස කුරේ මහතා මේ පිළිබඳ පොලිස්පතිවරයාගෙන් වාර්තාවක් ඉල්ලා සිටි අතර ඒ පිළිබඳ ප්‍රමුඛ දේශපාලකයන්ගේ නොකැමැත්ත පළ වී තිබුණි.

දේශපාලන අතපෙවීම් හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව එම කාලය තුළදී ද දැඩි පීඩනයකට ලක්වී ඇති අතර, මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා 2017 ජනවාරි මස සභාපති ධූරයෙන් ඉවත්වීමෙන් පසුව දේශපාලන අවශ්‍යතාව මත එහි කටයුතු සිදුවන බවට චෝදනා එල්ල විය.[17]

## 4.2 පොලිස් කොමිෂන් සභාවේ අභ්‍යන්තර ගැටලු

පොලිස් කොමිෂන් සභාවේ කටයුතු ගැන පැමිණිලි කරමින් එහි ස්ථිර කාර්යමණ්ඩලයේ සේවක පිරිසක් විසින් විගණකාධිපතිවරයා වෙත පෙත්සමක් ඉදිරිපත් කර තිබුණේ මීට පෙර වසර කිහිපයකට ඉහතදී ය. ඔවුන් සිය පෙත්සමෙන් මූලිකවම කර ඇති ඉල්ලීම වූයේ පොලිස් කොමිෂන් සභාවේ පරිපාලනය සහ මූල්‍ය පාලනය ගැන සාධාරණ පරීක්ෂණයක් කරන හැටියටය.

යහපාලන ආණ්ඩුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපේක්ෂා කළ අරමුණු මුදුන්පත් කරගත නොහැකි තත්ත්වයක පොලිස් කොමිෂන් සභාව පවතින බව කියමින් ඔවුන් එමගින් චෝදනා කර ඇත්තේ පොලිස් කොමිෂන් සභාව මහජන මුදල් කාබාසිනියා කරන සුදු අලියෙකු හැටියටය.

17. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් ආරියදාස කුරේ ඉවත් කළේ තෙල්දෙණිය ගැන පොලිස්පතිගෙන් වාර්තාවක් ඉල්ලු නිසයි! (2018, March 20).

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කාමර ගණනාවක් අනවශ්‍ය ලෙස කුලියට ගැනීමෙන් මාසික කුලිය හැටියට රුපියල් ලක්ෂ ගණනක නාස්තියක් සිදුවන බව ද ඔවුහු එමගින් අවධාරණය කර ඇත. ඇතැම් කාමරවලට මාසික කුලී ගෙව්ව ද පාවිච්චියට ගැනෙන්නේ කෙටි වේලාවකට යැයි ද ඔවුහු පවසති. 2015 දී කොමිෂන් සභාව පත්කරන විට එහි කාර්ය මණ්ඩලය 25ක් පමණ වූ අතර වර්තමානයේදී එය 100 ඉක්මවයි.

| නිලය | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යේෂ්ඨ | 32 |
| තෘතීයික | 05 |
| ද්විතීයික | 65 |
| ප්‍රාථමික | 21 |

*මූලාශ්‍රය - 2021 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව, ජාතික පොලිස් කොමිෂන් සභාව.*

අභියාචනා මණ්ඩල සම්බන්ධයෙන් ද තිබෙන්නේ යහපත් තත්ත්වයක් නොවේ. විශේෂයෙන්ම දින වකවානු ඉක්මවා ගිය හා සේවය හැර ගිය අභියාචනා ප්‍රතික්ෂේප වන බව බැලූ බැල්මටම පෙනෙන පසුබිමක ඒවා පොලිස් කොමිෂන් සභාව දක්වා ගෙන ඒමෙන් කාලයත් මුදලුත් නාස්තියක් සිදුවේ.

මේ අනුව පොලිස් කොමිෂන් සභාවේ බලතලත් කාර්ය හා කර්තව්‍යත් ක්‍රියාත්මක කිරීමේදී පැහැදිලි ගැටලූ රැසක් පැන නැගී ඇති බව පෙනේ. නීතියට අනුව කොමිෂන් සභාව ඇමැතිවරයාට කෙසේ වෙතත් පාර්ලිමේන්තුවට වග කිව යුතුය. කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය ගැන වාර්ෂික වාර්තා සම්පාදනය කෙරෙන්නේ ඒ අනුවය. 2017 වසරේ දෙසැම්බරයේදී මෙරට සංචාරයක නිරත එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරීන්ගේ කණ්ඩායමේ නිලධාරීන් විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් පැවැසුවේ ද ජාතික පොලිස් කොමිෂන් සභාව ශක්තිමත් නොමැති බවය. විශේෂයෙන්ම පොලිසිය විසින් කරන ලද අත්තනෝමතික රඳවාගැනීම් සහ වධහිංසා සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් වී ඇති පැමිණිලි විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් විය යුතු යැයි එහි සාමාජික ඕසේ ග්වේරා අවධාරණය කළේය.[18]

මීට අමතරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ පළාත් අධ්‍යක්ෂකවරුන් 05ක් 2021 වර්ෂයේදී සේවයෙන් ඉවත් වන බවට ලිඛිතව ජාතික පොලිස් කොමිෂන් සභාවට දන්වා තිබුණේය. ඔවුන් ඊට හේතු ලෙස පවසා ඇත්තේ පොලිස් කොමිෂන් සභාවේ හිටපු සභාපති විශ්‍රාමික පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතාගේ ක්‍රියාකලාපයන් නිසා කලකිරීමට පත්ව ඇති බවය.

මෙහිදී සේවයෙන් ඉවත් වන බවට ලිපි ලබා දී තිබුණේ සබරගමු පළාතේ දයානන්ද කොළඹගම, ඌව පළාතේ ටී.එම්. ඩබ්ලිව් තෙන්නකෝන්, මධ්‍යම පළාතේ කරුණාරත්න කැකුලන්දර, දකුණු පළාතේ පී. එස්. ගුණවර්ධන, වයඹ පළාතේ ඩබ්ලිව්.එම්. ජයවර්ධන යන හිටපු ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් පස් දෙනෙකි. පොලිස් කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරයාගෙන් මේ පිළිබඳව අදහස් විමසා සිටීමේදී ඔහු ලබා දුන් ප්‍රතිචාරය වූයේ මෙවැන්නකි.

චන්ද්‍රා ප්‍රනාන්දු මහතා සභාපතිවරයා ලෙස වැඩ බාරගත් දා සිට ඔහුට නිරීක්ෂණය වී ඇත්තේ කොමිෂන් සභාවේ නිලධාරීන් පොලිස් කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි වාර්තාවක් ලෙස සකසා අදාළ පොලිස් කොට්ඨාසයේ ජ්‍යේෂ්ට පොලිස් අධිකාරිවරයාට යොමු කර එම පැමිණිලි පිළිබඳව වාර්තාවක් සකසා එවන ලෙස ඉල්ලා සිටින ක්‍රමවේදයකි. එය කාර්යක්ෂම ක්‍රියාවලියක් නොවන බවත් 2018/2019 කාලය තුළ පොලිස් ස්ථානයන් හට යවන ලද ලිපි සඳහා ප්‍රතිචාරයන් ලැබී ඇත්තේ මෑතකදී බවත් එලෙස පැමිණිලි විමර්ශනය කිරීමට අපහසු බවත් ඒ මහතා පවසා සිටියි.

18. Gamage, B. M., & Jayawardane, T. (2018, March 21). කොමිසම් එපා කරවන පොලිස් කොමිසම. www.Lankadeepa.Lk.

ඉහත කී පළාත් අධ්‍යක්ෂකවරුන් පොලිසිය සමඟ කටයුතු කර ඇති ආකාරය හා පැමිණිලි විමර්ශනය කරන ආකාරය පවතින නීති රීති පිළිබඳව අවබෝධයකින් තොරව කටයුතු කර ඇති අතර පොලිස්පතිවරයා සමඟ ද සම්බන්ධතා පවත්වා නොමැති බව චන්ද්‍රා ප්‍රනාන්දු මහතා පවසා සිටියි.

මේ පිළිබඳව තවදුරටත් අදහස් දක්වමින් ඒ මහතා සඳහන් කර සිටියේ ඔහු මෙම නිලධාරීන් හට පැමිණිලි විමර්ශනය කළ යුතු ක්‍රමවේදය සහ පැමිණිලිකරුට සහනයක් වන ආකාරයෙන් කටයුතු කළ යුතු ක්‍රමවේදය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දීමට යෝජනා කළ නමුත් එය මෙම නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇති බවයි.[19]

2022 වසරේදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති චන්ද්‍රා ප්‍රනාන්දු මහතා හිටපු මුදල් අමාත්‍ය පිළිගැනීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණ සිටි පිරිස අතර සිටීම පිළිබඳව කතාබහට ලක්විය. මෙම සිද්ධිය සම්බන්ධයෙන්, බොහෝ පාර්ශ්වයන් ප්‍රශ්න කළේ ඔහු සහ පොලිස් කොමිෂන් සභාව තවදුරටත් ස්වාධීනව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකිද යන්නයි. එහිදී චන්ද්‍රා ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළ අදහස වූයේ,

''1990 දශකයේදී ශ්‍රී ලංකා පොලිසිය දූෂිත, අකාර්යක්ෂම, ජනතාවගේ සහ නීතියේ ආධිපත්‍යයේ උන්නතිය සඳහා ක්‍රියා නොකරන බවට චෝදනා එල්ල විය. මෙම ගැටලුවට විසඳුමක් ලෙස පොලිස් කොමිෂන් සභාව පිහිටුවන ලදී. එය ස්වාධීන කොමිෂන් සභාවක් යැයි පැවසුවද, "ස්වාධීන" යන යෙදුම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ.

''ජනාධිපතිවරයාගේ නිර්දේශ මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගෙන් පොලිස් කොමිෂන් සභාව සමන්විත වේ. එතැන නැවතත් දේශපාලනිකය. ස්වාධීනත්වය තිබෙන්නේ කොමිෂන් සභාවට වැඩ කරන අය තුළයි. පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් අර්ධ වශයෙන් වැඩ කරන ආකාරයේ සේවා කොන්දේසි තිබේ නම්, කෙනෙකුට චෝදනාවක් එල්ල කළ හැකිය. එහෙත් අප කෙතරම් ස්වාධීනද යන්න අප පසුගිය කාලය තුළ ප්‍රදර්ශනය කර ඇත්තෙමු. අප ස්වාධීනව වැඩ කරනවා නම් දෙවියන්ව මුණගැහෙන්න ගියත් කමක් නැත" යනුවෙනි.[20]

19. Right To Life Human Rights Center. (n.d.)
20. Samaraweera, B. B. (n.d.). *'If we work independently, it doesn't matter even if we go and meet God.'* Latest in the News Sphere | the Morning.

# 5. පොලිස් කොමිෂන් සභාවක් පිහිටුවීමේ පසුබිම සහ එහි ක්‍රියාකාරීත්වය - නීතීඥ බැසිල් ප්‍රනාන්දු

ශ්‍රී ලංකාව තුළ පොලිස් කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට බලපෑ හේතු පිරික්සීමේදී 1978 ව්‍යවස්ථාව පිළිබඳ ඇති වූ විශාල කලකිරීම පෙන්වා දිය හැකිය. ජනාධිපතිවරයාට සියලුම බලතල හිමිවීම තුළින් රටේ ඇති ප්‍රධාන ආයතන ගණනාවක ක්‍රියාකාරීත්වයට එය බාධාවක් විය. එම නිසා ඒ ආයතන පරිහානියට සහ කඩා වැටීමකට ලක්ව ඇති බවත්, රජයට එම ආයතන පවත්වාගෙන යාම පිළිබඳව ආරවුලක් මතු වී ඇති බවත් ඒ වන විට රටේ පිළිගැනීමක් තිබිණි. ඒ අනුව 17 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමට සියලු පක්ෂවල සහයෝගය හිමි විය. මෙම සංශෝධනය ගෙන ආ කාල වකවානුවේදී ආයතනවල ප්‍රධානීන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සෘජුව මැදිහත් නොවිය යුතු බවට මතවාදයක් තිබිණි.

මෙම අදහස පොලිසිය සම්බන්ධයෙන් ද පැවතිය අතර පොලිසියේ ඉහළ තනතුරු දරණ අයගේ පත් කිරීම් ද ජනාධිපතිවරයාගේ කැමත්තට අනුව සිදු නොවිය යුතු බවත් එම ක්‍රියාවලිය කිසියම් විෂය බද්ධ මධ්‍යස්ථ කණ්ඩායමක් විසින් සිදු කළ යුතු බවත් බොහෝ දෙනා පල කළ අදහසකි. ඒ අනුව පොලිස් කොමිෂන් සභාව පිහිටුවන ලදී.

**ශ්‍රී ලංකා පොලිසියේ වෘත්තීයමය භාවය අහිමිවී යාමසහ  පොලිස්පතිවරයා ලබා දී ඇති මාර්ගෝපදේශ**

රටේ පවතින ඉතාම ප්‍රබල නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය පිළිබඳව දැඩි විවේචනයක් අධිකරණය එක්තරා නඩුවකදී ප්‍රකාශයට පත් කරන ලදී. ඒ පොලිසියේ  වෘත්තීයභාවය ගිලිහී ඇති බවටය. 2008 වසරේ කොම්පඤ්ඤ වීදිය පොලිස් අත්අඩංගුවේ සිටි මොහොමඩ් ඉර්ෆාන් නමැති සැකකරුවෙකු විමර්ශන කටයුතු සඳහා  පිටතට රැගෙන ගිය අවස්ථාවේදී පළා යාමට තැත් කළේ යැයි වෙඩි තබා ඝාතනය කිරීමට එරෙහිව ඔහුගේ බිරිඳ වන ෆාතිමා ෂර්මිලා විසින් ඉදිරිපත් කළ පෙත්සමක තීන්දුව ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණය මෙවැනි සිදුවීම් අනාගතයේදී ඇති වීම වැළැක්වීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කර පෙබරවාරි මස 24 වනදා අධිකරණය හමුවේ ගොනුකරන ලෙස ඉකුත් පෙබරවාරි මස 05 වනදා පොලිස්පතිවරයාට නියෝග කර තිබුණි.

පොලිසිය යනු ඉහළ සිට පහළට පාලනය වන සංස්ථාවකි. ඒ අනුව මේ ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක වන්නේ එලෙසිනි. උදාහරණයක් වශයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු පිටතට රැගෙන යනවා නම් ඔහුගේ අත්වලට මාංචු දමා ගෙන යා යුතුය. නමුත් සාමන්‍යයෙන් සිදුවන්නේ අත්අඩංගුවට ගත් පුද්ගලයා පිටතට රැගෙන යාමේදී පොලිසියට පහරදී පලා යන්නට තැත් කළ විට ඔහුට වෙඩි තැබීමට සිදු වූ බව පොලිසිය ප්‍රකාශ කර සිටීමයි. එවැනි ප්‍රකාශයන් සිදු කිරීමෙන් වැළකීමට පොලිසියට වගකීමක් පැවරී ඇත. ඒ පොලිස්පතිවරයා ලබා දී ඇති මාර්ගෝපදේශ හරහාය. එලෙස ලබා දී ඇති මාර්ගෝපදේශවල ක්‍රියාත්මක වීම පිළිබඳ නිරීක්ෂණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ ප්‍රදේශය භාර සහකාර පොලිස් අධිකාරීවරයාට ය. ඔහු සතියකට වරක් ඔහුගේ යටතේ ඇති පොලිස් ස්ථානවලට පැමිණ කටයුතු හරියාකාරව සිදුවන්නේ ද යන්න සොයා බලා අධීක්ෂණය කළ යුතුයි. ඒ අනුව සහකාර පොලිස් අධිකාරීවරු සහ පොලිස් ස්ථානාධිපතිවරු නිසි ලෙස රාජකාරි කටයුතුවල නිරතවනවා නම් පෙර සඳහන් කළ ඝාතන සිදු වන්නට ඉඩක් නොමැත.

ශ්‍රී ලංකාවේ මේ දක්වා සිදු වී ඇත්තේ, එලෙස පොලිසිය විසින් ඝාතනයක් සිදු වී සමාජයට යම් හෙයකින් එය හෙළිදරව් වුවහොත් එම ඝාතනයේ වගකීම පැවරෙන්නේ ඝාතනය සිදු කිරීමට වෙඩි තැබූ නිලධාරීන්ට පමණි. නමුත් එහි වගකීම සෘජුවම පැවරිය යුත්තේ පොලිස් ස්ථානාධිපතිවරයාට සහ සහකාර පොලිස්

අධිකාරිවරයාටය. ඔවුන් නිසි ලෙස රාජකාරිය ක්‍රියාත්මක නොකිරීම නිසා මෙම මරණ සිදුවන අතර සෘජුව හෝ වක්‍රව ඔවුන්ගේ අනුදැනුම මත මෙම මරණ සිදුවන බවක් දැකගැනීමට හැකියාවක් පවතියි. එම නිසා එකී මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා මහජනතාව, මාධ්‍යය, සිවිල් සමාජ සංවිධාන සහ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තවදුරටත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කළ යුතුය.

ඒ වාගේම මෙම මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාවට යම්කිසි මැදිහත්වීමක් කිරීමට හැකියාවක් පවතියි. පොලිස් කොමිෂන් සභාවට පැහැදිලි චුවමනාවක් තිබේ නම් එහි රාජකාරිය විය යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි සඳහන් කරමින් ගත යුතු පියවර පොලිසිය වෙත ලබා දීමයි. එහිදී අපරාධයක් කළු වරදට දඬුවම් නොකර අපරාධ වැළැක්වීම කළ නොහැකි කාර්යයකි. එම නිසාවෙන් එලෙස ඝාතනයක් සිදුවූ විට පොලිස් නිලධාරීන් හට අවවාද ලබාදීම, ස්ථාන මාරු ලබාදීම සහ වින්දිතයන් හට වන්දි ලබාදීම මඟින් අනාගතයේ සිදුවන්නට නියමිත මෙවැනි අපරාධ නතර කළ නොහැකිය. ඒ අනුව පොලිසිය අතින් යම්කිසි ඝාතනයක් සිදු වූ විටක ඒ සිදුවීමට අදාළ ඉහළ පොලිස් නිලධාරීන් හට වක්‍රාකාරයෙන් මිනීමැරුමකට සම්බන්ධ බවට චෝදනා ගොනු කරමින් නඩුවක් පවරනවා නම් ලංකාවේ පොලිස් ස්ථානයන් විසින් සිදුවන ඝාතන අවම කරගැනීමට හැකියාවක් ඇත. නමුත් එය අද වන තුරු සිදු වී නොමැත.

Juris Prudence හෙවත් නීති විද්‍යාවේ සඳහන් වන මූලධර්මවලට අනුව අපරාධ නතර වන්නේ අපරාධවලට දෙනු ලබන විශාල දඬුවම් නිසා නොවනමුත් අපරාධයක් සිදු වූ වහාම එය අල්ලා ගැනීමට නීතිය ක්‍රියාත්මක වන තැනය. අපරාධකරුවන් ආරක්ෂා නොකළ යුතු දෙයක් වන්නේ එබැවිනි. ජාතික පොලිස් කොමිෂන් සභාව හරියාකාරව රාජකාරි වැඩකටයුතුවල නිරත වනවානම් මේ සා විශාල දූෂණ මෙන්ම පවතින ආර්ථික අර්බුදය වළක්වා ගැනීමට හැකියාවක් පවතියි.

**පොලිසිය ඩිජිටල්කරණය කිරීම**

චුවමනාවෙන්ම කඩාකප්පල් කරනු ලැබූ පොලිස් සංස්ථාව නැවත ගොඩනගාගන්නේ කෙසේද යන ප්‍රශ්නය රටේ උද්ගතව ඇති ප්‍රධාන පෙළේ ගැටලුවකි. එම පැනයට පිළිතුරු සපයා ගතහොත් රටේ වෙනසක් ඇති කිරීමට හැකියාවක් පවතියි. එහිදී විවිධ උපක්‍රම ලෙස කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන ක්‍රමෝපායන් භාවිතා කළ හැකියි. උදාහරණයක් ලෙස දැනට පවතින සියලුම පොලිස් කටයුතු නව ඩිජිටල් තාක්ෂණය යටතට ගෙන එමට ඉඩක් ඇත. එහිදී කාර්යක්ෂමතාවයේ දියුණුවක් දැක ගැනීමට අවස්ථාවක් උදාවේ. මෙහිදී පොලිස් කොමිෂන් සභාව කළ යුත්තේ රජයෙන්, අදාළ අමාත්‍යාංශ මඟින් සහ බාහිර සමාජයෙන් ද සහයෝගය ලබාගෙන පොලිස් සේවයේ යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීමට කටයුතු කිරීමයි. එසේ කිරීමෙන් කාලය ඉතුරු කර ගැනීමට සහ පොලිසියේ අධ්‍යාපන මට්ටම ද වෙනස් කිරීමටද හැකියාවක් ඇත. අද වන විට අපරාධ සිදුවන්නේ ඉතාමත්ම සූක්ෂම අයුරිනි එම නිසා පොලිස් නිලධාරීන්ගේ අධ්‍යාපන මට්ටම් ද ඉහළ තලයක පැවතීම සුවිශේෂී කරුණකි.


**මහජන මුදලින් නඩත්තු වන කොමිෂන් සභා**

රජයේ මුදලින් යම් ආයතන නඩත්තු වනවානම් එම මුදල් ගෙවන්නේ යම් සාධනීය කාර්යයක් කිරීමටය යන අදහස පුරවැසියන් තුළ හටගත යුතුය. බොහෝ ආයතන ස්ථාපිතව පැවතිය ද ඒවායේ අරමුණු වන්නේ රාජකාරි කරවීම නොව කිසියම් මවා පෑමක් කිරීම ය. අර්බුද පවතින සමයක පුරවැසියන් කලකිරීමකින් තොරව තබාගැනීමට නම් නොයෙකුත් මවාපෑම් මෙම ආයතන මඟින් සිදු කරනු ලැබේ. එම නිසා පුරවැසියන් ඉතාමත් සවිඥාණිකව මේ දෙස බැලිය යුතු වන අතර මෙම ආයතන කාර්යක්ෂමව, අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කරවීමට සිවිල් සමාජය තුළින් බලපෑමක් එල්ල කළ යුතුව ඇත.


# 6. පොලිස් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි පිළිබඳව විශ්ලේෂණය

## 6.1 පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා ඇසුරෙන් විශ්ලේෂණය


පසුගිය වසර දෙක තුළ ශ්‍රී ලංකා පොලිසියට එරෙහිව ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබී ඇති ලිඛිත මහජන පැමිණිලි සංඛ්‍යාව 3569 කි. ඒ 2021 වර්ෂයේදී ලද පැමිණිලි 1893 ක් සහ 2022 වර්ෂයේදී ලද පැමිණිලි 1676 ක් ලෙසය. (2022 වර්ෂය වන විට බස්නාහිර පළාතේ කාර්යාල දෙකක් පිහිටුවා ඇති බැවින් පහත ප්‍රස්ථාරයේ 2022 වර්ෂයේ බස්නාහිර පළාතට අදාළව ලැබී ඇති 642 ක පැමිණිලි සංඛ්‍යාව බස්නාහිර I කාර්යාලයට ලද පැමිණිලි 346 න් සහ බස්නාහිර II කාර්යාලයට ලද පැමිණිලි 296 එකතුවෙන් පෙන්වා ඇත)




මීට අමතරව 1960 ක්ෂණික දුරකතන අංකය ඔස්සේ ද ඉහත සඳහන් වර්ෂ දෙකට අදාළව පැමිණිලි ලැබී ඇත. 2021 වර්ෂයේදී එලෙස ලැබූ මුළු ඇමතුම් සංඛ්‍යාව 14198 ලෙස සඳහන් වුවද කොමිෂන් සභා විෂය පථයට අදාළව ලද ඇමතුම් සංඛ්‍යාව 3317 කි. 2022 වර්ෂය දෙස අවධානය යොමු කරන විට එම ක්ෂණික දුරකතන අංකය හරහා ලැබී ඇති මුළු ඇමතුම් ගණන 9774 ක් වන අතර කොමිෂන් සභා විෂය පථයට අදාළව ලද ඇමතුම් ගණන 5165 කි. සමස්ථයක් ලෙස ගත් විට 2021 වර්ෂයේදී ලිඛිතව ලද පැමිණිලි සහ 1960 මඟින් කොමිෂන් සභාවේ විෂය පථයට අදාළව ලද පැමිණිලි සංඛ්‍යාවේ එකතුව 5206 කි. එමෙන් ම 2022 වර්ෂයේදී එම සංඛ්‍යාව 6841 දක්වා ඉහළ ගොස් ඇත.





ඒ අනුව 2021 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත ලිඛිතව ලැබුණු මහජන පැමිණිලි 1893හි ප්‍රගතිය දෙස අවධානය යොමු කළ විට එම මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 69% ක් එනම් පැමිණිලි 1305ක් 2021 වර්ෂයේදී අවසන් කර නොමැත. මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 17%ක් වන පැමිණිලි 325 ක් අවසන් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ලිපිගොනු ඉදිරිපත් කිරීමට ඉතිරි වී ඇත. එබැවින් 2021 වර්ෂයේදී කොමිෂන් සභාව විමර්ශන අවසන් කර ඇත්තේ මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් 14% ක් පමණි එනම් පැමිණිලි 263 කි.




පොලිස් කොමිෂන් සභාව සඳහන් කරන පරිදි පැමිණිලි අවසන් කිරීමට ප්‍රමාද වී ඇත්තේ; පැමිණිලි විභාග කිරීමේ ක්‍රමවේදය වෙනස් කිරීම සහ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් පුහුණු කිරීමට සිදුවීම, කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් නිලධාරීන්ගේ පැමිණීම සීමාවීම, තැපැල් කටයුතු නවතාලීම හේතුවෙන් වැඩකටයුතු ප්‍රමාද වීම සහ ඉල්ලා අස් වූ අධ්‍යක්ෂකවරු පස් දෙනා වෙනුවට නව අධ්‍යක්ෂකවරුන් පත් කර ඇත්තේ නොවැම්බර් මාසයේ වීම යන කාරණා හේතු කොටගෙනය.

2022 වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලිඛිතව යොමු කරන ලද 1676ක් වන මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් විමර්ශන අවසන් කිරීම සඳහා පළාත් කාර්යාලවල ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව 988කි. එය ප්‍රතිශතයක් ලෙස ගත් කල 59% කි. 2022 වර්ෂයේදී විමර්ශන අවසන් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුව ඇති ලිපි ගොනු සංඛ්‍යාව මුළු පැමිණිලි ගණනින් 14% කි එනම් පැමිණිලි 236කි. එබැවින් 2022 වර්ෂයේදී කොමිෂන් සභාවට විමර්ශන අවසන් කිරීමට ලැබී ඇත්තේ මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලි 452 ක් පමණක් වන අතර එහි ප්‍රතිශතය 27% කි.




නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම්, අසත්‍ය චෝදනා, පහරදීම්, වධහිංසා පැමිණවීම්, පක්ෂග්‍රාහීත්වය, බලය අයුතු ලෙස භාවිත කිරීම, මෙන්ම පොලිසියේ අකාර්යක්ෂමතාව වැනි සිද්ධීන් මෙම පැමිණිලිවලට ඇතුළත් ය. එම පැමිණිලිවල ස්වභාවයන් අනුව 2021 සහ 2022 වර්ෂවලට අදාළව ලද පැමිණිලි පහත පරිදිය.

| **පැමිණිල්ලේ ස්වභාවය** | **2021 වර්ෂයේදී ලද පැමිණිලි සංඛ්‍යාව** | **2022 වර්ෂයේදී ලද පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|---|
| පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 640 | 516 |
| පහරදීම | 30 | 403 |
| වධහිංසා පැමිණවීම | 16 | 339 |
| බලය අයථා ලෙස පරිහරණය | 459 | 217 |
| කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 8 | 31 |
| නීතිවිරෝධී ලෙස රඳවා ගැනීම | 23 | 20 |
| අල්ලස් දූෂණ | 18 | 64 |
| පක්ෂග්‍රාහීවීම් | 409 | 5 |
| බොරු චෝදනා කිරීම | 57 | 3 |
| පොලිස් අත්අඩංගුවේ සිටියදී මරණය සිදුවීම | 1 | 27 |
| මත්ද්‍රව්‍ය වැරදි | 40 | 1 |
| වෙනත් | 192 | 50 |
| **එකතුව** | **1893** | **1676** |

මීට අමතරව 27/02/2023 දින රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කළ තොරතුරු ඉල්ලුම් පත්‍රයට NPC/AD/RTI/2023-(25) අංකය යටතේ පිළිතුරු ලිපියක් ලැබී ඇත. ඉල්ලුම් කර තොරතුරු පහත පරිදිය.

2022 වර්ෂයේ ජනවාරි මස සිට 2023 ජනවාරි මස දක්වා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවෙන්ල

1. නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්, නීති විරෝධී රඳවා ගැනීම්, වධහිංසා, නීති විරෝධී ඝාතන සහ පොලිසිය භාර නොගත් පැමිණිලි වෙනුවෙන් කොමිෂන් සභාවට යොමු වී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද?

2. ඉන් ලියාපදිංචි කළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද?

3. විමර්ශනය කිරීමට ආරම්භ කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද?

4. විමර්ශන අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද?

5. නිර්දේශ ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද?

6. ලබා දී ඇති නිර්දේශවල ක්‍රියාත්මකවීම කෙසේද?

ඒ අනුව ඊට ලැබී තිබූ පිළිතුරු පහත සඳහන් වේ.[21]

01. 2022 වර්ෂයේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලද පැමිණිලි සංඛ්‍යාවෙන්,

| | | |
|---|---|---|
| 01 | පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 516 |
| 02 | වධහිංසා පැමිණවීම | 05 |
| 03 | නීති විරෝධී ලෙස රඳවා ගැනීම | 20 |
| 04 | පොලිස් අත්අඩංගුවේ සිටියදී මරණ | 01 |
| | එකතුව | 542 |

02. ඉන් ලියාපදිංචි කළ පැමිණිලි සංඛ්‍යාව 542

03. විමර්ශනය ආරම්භ කර ඇති පැමිණිලි සංඛ්‍යාව 542

04. විමර්ශන අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව 200

05. නිර්දේශ ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව 200

06. ලබා දී ඇති නිර්දේශවල ක්‍රියාත්මක වීම 200

2022 ප්‍රකාශයට පත් පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාවට අනුව එම වර්ෂයේ කොමිෂන් සභාවට ලද ලිඛිත පැමිණිලි සංඛ්‍යාව 1676ක් වන අතර අප මධ්‍යස්ථානයෙන් යොමු කළ තොරතුරු ඉල්ලුම් පත්‍රය හරහා ඉල්ලුම් කළ තොරතුරුවලට ප්‍රතිචාර දක්වමින් පොලිස් කොමිෂන් සභාව දන්වා සිටියේ 2022 වර්ෂයේ ජනවාරි මස සිට 2023 ජනවාරි මස දක්වා කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති පැමිණිලි සංඛ්‍යාව 542 ලෙසිනි. නමුත් එම කාර්ය සාධන වාර්තාවටම අනුව 2022 වර්ෂයේදී ලද පැමිණිලි සම්බන්ධයෙන් දැක්වෙන්නේ පහත පරිදිය.

21. ඇමුණුම 1

| පළාත | 2022 වර්ෂය තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව | 2022.12.31 දින වන විට පළාත් කාර්යාල මඟින් විමර්ශන අවසන් කර පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් වෙත යොමු කර ඇති සංඛ්‍යාව | 2022.12.31 දින වන විට කොමිෂන් සභාව මඟින් විමර්ශන අවසන් කර ඇති සංඛ්‍යාව | 2022.12.31 දිනට විමර්ශන අවසන් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුව ඇති ලිපි ගොනු සංඛ්‍යාව | විමර්ශන අවසන් කිරීමට පළාත් කාර්යාලවල ඉතිරිව ඇති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බස්නාහිර 1 | 346 | 95 | 95 | - | 251 |
| බස්නාහිර 11 | 296 | 92 | 92 | - | 204 |
| මධ්‍යම | 146 | 32 | 23 | 9 | 114 |
| දකුණ | 259 | 101 | 76 | 25 | 158 |
| උතුර | 60 | 25 | 4 | 21 | 35 |
| නැගෙනහිර | 78 | 62 | 22 | 40 | 16 |
| වයඹ | 161 | 87 | 44 | 43 | 74 |
| උතුරු මැද | 113 | 90 | 27 | 63 | 23 |
| ඌව | 89 | 50 | 25 | 25 | 39 |
| සබරගමුව | 128 | 54 | 44 | 10 | 74 |
| **එකතුව** | **1676** | **688** | **452** | **236** | **988** |

එමෙන්ම පැමිණිල්ලේ ස්වභාවය අනුව කාර්ය සාධන වාර්තාවේ තිබෙන සංඛ්‍යාත්මක දත්ත හා අප මධ්‍යස්ථානය විසින් යොමු කළ තොරතුරු ඉල්ලුම් පත්‍රයට පිළිතුරු වශයෙන් ලබාදුන් සංඛ්‍යාත්මක දත්ත අතර ද යම් පරස්පරතාවක් පවතියි.

මීට අමතරව 2020 වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දින පත්වූ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් එතෙක් පැවති විමර්ශන ක්‍රමවේදයේ ස්වභාවය, කාර්යක්ෂමභාවය, කොතෙක් දුරට මහජනයාට සහන සලසා තිබුණේද යන්න පිළිබඳව දැඩිව අධ්‍යයනය කර ඇත. ඒ අනුව එම කොමිෂන් සභාව විසින් මහජන පැමිණිලි විමර්ශනය සඳහා අනුගමනය කළ කාර්යය පටිපාටියේ පැවති දුර්වලතාවන් පෙන්වාදී විධිමත් විමර්ශන ක්‍රමවේදයන්ට අනුව මහජන පැමිණිලි විමර්ශනය කිරීමට නව ප්‍රවේශයක අවශ්‍යතාව හඳුන්වාදෙන ලදී.

මෙම නව ක්‍රමයේ විශේෂතම ලක්ෂණ වන්නේ මහජන පැමිණිල්ල ලද පසු පැමිණිල්ල අධ්‍යයනය කොට පැමිණිලිකරුවන් සඳහන් කර ඇති කරුණු කාරණා සහ ඉල්ලා ඇති සහන සම්බන්ධයෙන් පරීක්ෂාවට භාජනය කිරීමයි. වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් නැවතත් පැමිණිලිකරුවන්ගෙන් විමසීම් කොට වැඩිදුර තොරතුරු ලබාගෙන පසුව පැමිණිල්ලට අනුකූල වන පරිදි අදාළ පොලිස් ස්ථානයෙන් ලේඛනගත සාක්ෂි ද ලබාගෙන පැමිණිල්ලේ දක්වා ඇති පරිදි එම සිදුවීම සිදුවූයේද, නැතහොත් සිදු නොවූයේද යන සමබරතාවය මත සිට සාධාරණ වන තීරණයන්ට එළැඹ, මහජන පැමිණිලි සම්බන්ධයෙන් මහජනතාවට සහන සැලසීම වේ.

ඉහත පෙන්නුම් කර ඇති පරිදි පොලිස් කොමිෂන් සභාව එතෙක් විමර්ශන කටයුතු කරගෙන ආ ක්‍රමවේදය වෙනස් කරමින් නව මුහුණුවරකට අවතීර්ණ වූ බවත් පැමිණිලි විමර්ශනයේ දී මතු වූ ප්‍රමාද දෝෂ වළක්වා ගැනීමට හැකියාවක් ලැබී ඇති බවත් ප්‍රකාශ කර සිටියි. එනමුත් මෙම ක්‍රමවේදය එලෙසම ක්‍රියාත්මක වනවාද යන්න මේ වන විට මතුව ඇති ගැටලුවකි. ඒ අනුව පොලිස් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය තවදුරටත් සමීප විමර්ශනයකට බඳුන් කිරීම පිණිස රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබූ සිද්ධි අධ්‍යයනය හරහා එහි කාර්යක්ෂමතාව මෙන්ම ස්වාධීනත්වය පිළිබඳව ද විශ්ලේෂණාත්මක අදහසක් ලබා ගැනීමට හැකියාවක් පවතියි.

## 6.2 2022 මැයි මාසයේ සිට 2023 පෙබරවාරි මස දක්වා මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මඟින් පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය


රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ මඟ පෙන්වීම යටතේ පවත්වාගෙන යනු ලබන මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන වෙත පැමිණෙන වින්දිතයන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කළ පැමිණිලි (2022 මැයි මස සිට 2023 පෙබරවාරි මස දක්වා; පැමිණිලි 36ක්) හා ඊට ලැබී ඇති ප්‍රතිචාරයන් මෙම අධ්‍යයන වාර්තාවට ඇතුළත් කිරීමට තීරණය කළේ මෙහි ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහාය.

2018 වර්ෂයේදී නියමු වැඩසටහන් ලෙස දිස්ත්‍රික්ක 3ක ආරම්භ කළ මෙම මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මේ වන විට දිස්ත්‍රික්ක 13ක පිහිටුවා තිබේ. මෙමඟින් තම බල ප්‍රදේශය තුළ ජීවත්වන පුද්ගලයෙකුගේ කඩවීමට හෝ කඩවීමට ආසන්නව පවතින අයිතිවාසිකම් වෙනුවෙන් පුහුණුවක්සහ අත්දැකීම් සහිත මානව හිමිකම් ආරක්ෂකයින් විසින් අදාළ වින්දිතයන්ට තම අයිතිවාසිකම් සුරක්ෂිත කරගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධව අවශ්‍ය මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

එම මඟපෙන්වීම මත තමන් මුහුණ දුන් මානව හිමිකම් කඩවීම පිළිබඳව ගැටලු අදාළ වින්දිතයන් විසින් ස්වාධීන කොමිෂන් සභා ඇතුළු අනෙකුත් ආයතන වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ.


ඒ අනුව 2022 මැයි මස සිට 2023 පෙබරවාරි මස කාල සීමාව තුළ ඉහත සඳහන් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන 13න් 6ක මඟපෙන්වීම යටතේ යොමු කළ පැමිණිලි සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පහත විශ්ලේෂණය තුළින් පෙන්වා දේ.

**දිස්ත්‍රික්ක වශයෙන් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව**





මෙහිදී තහවුරු කර ගත් දත්තයන්ට අනුව සලකා බැලීමේදී දිස්ත්‍රික්ක 06ක් අතුරින් පොලිස් කොමිෂන් සභාව වෙත සිදු කළ පැමිණිලි 36ක් හඳුනාගත හැකිවිය. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයෙන් 13ක්ද, මාතර දිස්ත්‍රික්කයෙන් 07ක්ද, ගාල්ල දිස්ත්‍රික්කයෙන් 04ක්ද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් 05ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 04ක්ද සහ මොණරාගල දිස්ත්‍රික්කයෙන් 03ක්ද වශයෙන් මහජනතාවට සිදුවූ අකටයුතුකම් සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කොට තිබේ.


**ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිල්ලේ ස්වභාවය අනුව යොමු කර ඇති පැමිණිලි සංඛ්‍යාව**




මෙම පැමිණිලි ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර කිහිපයක් යටතේ වර්ග කර බෙදා දැක්විය හැක. එනම්, නීතිවිරෝධී ඝාතන, නීති විරෝධී අත් අඩංගුවට ගැනීම්, නීතිවිරෝධී රඳවා තබා ගැනීම්, වධහිංසනයට ලක් කිරීම්, පැමිණිලි විභාග කිරීම පැහැර හැරීම සහ පොලිස් නිලධාරීන්ගෙන් සිදු වූ වෙනත් අකටයුතුකම් වශයෙනි. මෙම පැමිණිලි ඉහත ක්ෂේත්‍රයන්ට අදාළව වර්ගීකරණය කිරීමේදී අනාවරණය වූයේ ඉහත පැමිණිලි අතුරින් නීති විරෝධී අත් අඩංගුවට ගැනීම් 7%ක් ද, නීති විරෝධී රඳවා තබා ගැනීම් 14%ක්ද, වධහිංසනයට ලක් කිරීම් 31%ක්ද, පැමිණිලි විභාග කිරීම පැහැර හැරීම් 17%ක් ද සහ වෙනත් අකටයුතුකම් 31%ක්ද වශයෙන් බෙදීමට ලක්වන බවයි. මෙහිදී නීතිවිරෝධී ඝාතන සම්බන්ධයෙන් මෙම කාල සීමාව තුළ පැමිණිලි යොමු වී නොමැති බව නිරීක්ෂණය වේ.



**යොමු කළ පැමිණිලි සඳහා ලැබී ඇති ප්‍රතිචාරය**




ඉහත පැමිණිලි සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාවේ ප්‍රතිචාරය කෙබඳුද යන්න පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ ඉහත සමස්ථ පැමිණිලිවලින් කොමිෂන් සභාව මගින් ප්‍රතිචාර ලැබී ඇත්තේ 61.11%ක ප්‍රතිශතයක් සම්බන්ධයෙන් බවයි. ඒ අනුව 16.67%ක ප්‍රමාණයකට කොමිෂන් සභාවේ ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර වින්දිතයා විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු පවත්වාගෙන යාම නතර කිරීම හේතුවෙන් 22.22%ක ප්‍රතිශතයක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වී නොමැත.

පොලිස් කොමිෂන් සභාව මගින් ප්‍රතිචාර ලැබී ඇති ඉහත 50%ක ප්‍රමාණය සම්බන්ධයෙන් තවදුරටත් සලකා බැලීමේදී නිරීක්ෂණය වන්නේ එම පැමිණිලි සියල්ලම සම්බන්ධයෙන් පොලිස් කොමිෂන් සභාව මගින් විමර්ශන පැවැත්වීමක් සිදු කොට ඇති බවයි. නමුත් එලෙස විමර්ශන පැවැත්වූ පැමිණිලි තවදුරටත් සලකා බැලීමේදී ඉන් 57%ක ප්‍රමාණයකට අදාළ වින්දිතයින් ප්‍රකාශ කරන්නේ තමන්ට පොලිස් කොමිෂන් සභාව මගින් මේ වන තෙක් සාධාරණයක් ඉටු වී නොමැති බවයි.

මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන අතරින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත 2022 මැයි මස සිට 2023 පෙබරවාරි මස දක්වා වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් යොමු කළ කුසුම් මහත්මිය මෙම අධ්‍යයන වාර්තාව සඳහා කළ අදහස් විමසීමකදී සඳහන් කර සිටියේ කෙතරම් පැමිණිලි කොමිෂන් සභාව වෙත යොමු කර සිටියද එම පැමිණිලි සඳහා ප්‍රතිචාර ලැබෙන්නේ ඉතාමත් දීර්ඝ කාලයකට අනතුරුව බවයි. ඇතැම් අවස්ථාවන්හිදී කොමිෂන් සභාව විසින් ප්‍රතිචාර නොදක්වන ස්වභාවයක් ද ඇති බවට ඇය ප්‍රකාශ කර සිටියි.

යොමු කරන ලද පැමිණිලි සම්බන්ධව කඩිනමින් විමර්ශන කටයුතු ආරම්භ කර වින්දිතයන් හට පොලිස් කොමිෂන් සභාවේ මැදිහත්වීමෙන් සහන සැලසේ යැයි වින්දිතයන් අපේක්ෂා කර සිටියද කොමිෂන් සභාවේ අකාර්යක්ෂමතාවය සහ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් වින්දිතයන් තුළ ද කොමිෂන් සභාව පිළිබඳ ඇත්තේ පළුදු වූ විශ්වාසයක් බවත් ඒ නිසාවෙන්ම ඇතැම් වින්දිතයන් ඔවුන් යොමු කළ පැමිණිලි සම්බන්ධයෙන් කෙරෙන ඉදිරි කටයුතු පිළිබඳ උනන්දුවක් නොදක්වන බවත් කුසුම් මහත්මිය සඳහන් කර සිටියි.

ඉහත වාර්තාගත සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ දිනපතා වීදිවල සිදුවන සත්‍ය සිදුවීම් සංඛ්‍යාවට සාපේක්ෂව කුඩාය. පොලිස් ප්‍රචණ්ඩ ක්‍රියා සහ විෂමාචාර පිළිබඳ වාර්තා වන මෙම ඉහළ සංඛ්‍යාව සමඟ වුවද, වරදකරුවන් වීමේ ප්‍රතිශතය සහ පැමිණිලි විසඳීම ඉහළ මට්ටමක පවතිනු ඇතැයි යමෙකු අපේක්ෂා කරනු ඇත,

මන්ද එය සහතික කිරීම සඳහා වගකිව යුතු ජාතික පොලිස් කොමිෂන් සභාව නමින් කැපවූ අධීක්ෂණ ආයතනයක් ඇති බැවිනි.

කෙසේ වෙතත්, පුරවැසියන්ට කෲර ලෙස බලය යෙදවීම ඇතුළු විෂමාචාර සම්බන්ධයෙන් නිලධාරීන්ට නඩු පවරනු ලබන්නේ කලාතුරකිනි. දුර්ලභ අවස්ථාවන්හිදී, වැරදිකරුවන් වන නිලධාරීන්ට සුළු විනයානුකූල දඬුවම් හෝ අනතුරු ඇඟවීම් ලබා දෙනු ලැබේ. "පොලිස් නිලධාරීන් තමන් වීදිවල කරන දේ සම්බන්ධයෙන් තමන් කිසිවිටෙක වගකිව යුතු යැයි විශ්වාස කරන්නේ නැත" යන්න ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති හා වැඩසටහන් අධ්‍යක්ෂ, නීතිඥ බැසිල් ප්‍රනාන්දු මහතාගේ අදහසය. තවද, රටේ පොලිසිය සමඟ ඇති ගැටලුවලට මූලික හේතුව ශක්තිමත් වැඩ සංස්කෘතියක් නොමැතිකමත් සහ ජාතික පොලිස් කොමිෂන් සභාව ආරම්භයේ සිටම එහි ක්‍රියාකාරිත්වය ඔහු නිරීක්ෂණය කරමින් සිටින බවත් එම ආයතනය පිළිබඳ ව සතුටට පත් විය නොහැකි අතර එහි ඇත්තේ කඩදාසි බලය පමණක් බවත් ඒ මහතාගේ නිගමනයයි. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය ඉතා බලවත් ආයතනයක් වුවද ජාතික පොලිස් කොමිෂන් සභාව සිදු කරන්නේ පොලිසියේ මහජන සම්බන්ධතා කාර්යයක් පමණක් බව තවදුරටත් මේ අදහස් ඔස්සේ ප්‍රත්‍යක්ෂ වෙමින් පවතියි.

# නිර්දේශ

1. ජාතික පොලිස් කොමිෂන් සභාව මඟින් ගනු ලබන තීරණ නිසි පරිදි ක්‍රියාත්මක වනවාද යන්න සොයා බැලීම සඳහා පසු විපරම් යාන්ත්‍රණයක් සකස් කිරීම.

2. පොලිසිය පිළිබඳ විමර්ශන පවත්වමින් ජාතික පොලිස් කොමිෂන් සභාව පර්යේෂණ ආයතනයක් ලෙසින් ක්‍රියාත්මක වීම.

3. පොලිස් සේවයේ යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීම මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාව සහ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම.

4. ජාතික පොලිස් කොමිෂන් සභාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය යටතේ පවතින නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර භාවිතා කරන්නන්ගේ පහසුව පිණිස පවත්වාගෙන යාම.

5. ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය කර නිර්දේශ ලබා දීමට නිශ්චිත කාල පරිච්ඡේදයක් සකසා ගැනීම මඟින් වින්දිතයන්ගේ විශ්වාසනීයත්වය කොමිෂන් සභාව කෙරෙහි රඳවා තබා ගැනීම.

# ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය


**වෙබ් අඩවි**

1. Wiki, E. B. &. (2020). National Police Commission (Sri Lanka) - EverybodyWiki Bios & Wiki. EverybodyWiki Bios & Wiki. https://en.everybodywiki.com/National_Police_Commission_(Sri_Lanka)

2. LankaWeb – ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් ආරියදාස කුරේ ඉවත් කළේ තෙල්දෙණිය ගැන පොලිස්පතිගෙන් වාර්තාවක් ඉල්ලූ නිසයි! (2018, March 20). https://www.lankaweb.com/news/items/2018/03/20/%e0%b6%a2%e0%b7%8f%e0%b6%ad%e0%b7%92%e0%b6%9a-%e0%b6%b4%e0%b7%9c%e0%b6%bd%e0%b7%92%e0%b7%83%e0%b7%8a-%e0%b6%9a%e0%b7%9c%e0%b6%b8%e0%b7%92%e0%b7%82%e0%b6%b1%e0%b7%8a-%e0%b7%83%e0%b6%b7%e0%b7%8f/

3. ස්වාධීන කොමිෂන් කාටද. (n.d.). https://www.lankadeepa.lk/features/%E0%B7%83%E0%B7%8A%E0%B7%80%E0%B7%8F%E0%B6%B0%E0%B7%93%E0%B6%B1-%E0%B6%9A%E0%B7%9C%E0%B6%B8%E0%B7%92%E0%B7%82%E0%B6%B1%E0%B7%8A-%E0%B6%9A%E0%B7%8F%E0%B6%A7%E0%B6%AF/2-534540

4. පොලිසියේ ප්‍රශ්න විසඳන පොලිස් කොමිසමේ සභාපති ප්‍රශ්නය. (2019, March 8). සිළුමිණ. https://www.silumina.lk/2019/03/09/%E0%B7%80%E0%B7%92%E0%B7%81%E0%B7%9A%E0%B7%82%E0%B7%8F%E0%B6%82%E0%B6%9C/%E0%B6%B4%E0%B7%9C%E0%B6%BD%E0%B7%92%E0%B7%83%E0%B7%92%E0%B6%BA%E0%B7%9A-%E0%B6%B4%E0%B7%8A%E2%80%8D%E0%B6%BB%E0%B7%81%E0%B7%8A%E0%B6%B1-%E0%B7%80%E0%B7%92%E0%B7%83%E0%B6%B3%E0%B6%B1-%E0%B6%B4%E0%B7%9C%E0%B6%BD%E0%B7%92%E0%B7%83%E0%B7%8A-%E0%B6%9A%E0%B7%9C%E0%B6%B8%E0%B7%92%E0%B7%83%E0%B6%B8%E0%B7%9A-%E0%B7%83%E0%B6%B7%E0%B7%8F%E0%B6%B4%E0%B6%AD%E0%B7%92-%E0%B6%B4%E0%B7%8A%E2%80%8D%E0%B6%BB%E0%B7%81%E0%B7%8A%E0%B6%B1%E0%B6%BA

5. කොමිසම් එපා කරවන පොලිස් කොමිසම. (n.d.). https://www.lankadeepa.lk/sunday/features/%E0%B6%9A%E0%B7%9C%E0%B6%B8%E0%B7%92%E0%B7%83%E0%B6%B8%E0%B7%8A-%E0%B6%91%E0%B6%B4%E0%B7%8F-%E0%B6%9A%E0%B6%BB%E0%B7%80%E0%B6%B1-%E0%B6%B4%E0%B7%9C%E0%B6%BD%E0%B7%92%E0%B7%83%E0%B7%8A-%E0%B6%9A%E0%B7%9C%E0%B6%B8%E0%B7%92%E0%B7%83%E0%B6%B8/2-525978

**ග්‍රන්ථ**

1. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL.

2. 2021 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව, ජාතික පොලිස් කොමිෂන් සභාව

3. 2022 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව, ජාතික පොලිස් කොමිෂන් සභාව

**ඇමුණුම 1**

ජාතික පොලිස් කොමිෂන් සභාව
தேசிய பொலிஸ் ஆணைக்குழு
**National Police Commission**

අංක 9 ගොඩනැගිල්ල, B.M.I.C.H. පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
9 ஆம் இலக்கக் கட்டிடம், B.M.I.C.H. வளாகம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07.
Block No. 9, B.M.I.C.H. Premises, Bauddhaloka Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இல. / My No. NPC/AD/RTI/2023-(25)
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023.06. 01

නිතිඥ ලක්ෂාන් ප්‍රනාන්දු මහතා
14 බී
ජයසූරිය මාවත
වැවල
ජා ඇල.

<u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම.</u>

උක්ත පනත යටතේ ඔබ විසින් යොමු කර ඇති 2023.02.27 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.

I. 2022 වර්ෂයේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලද පැමිණිලි සංඛ්‍යාවෙන්

| | | |
|---|---|---|
| 01 | පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 516 |
| 02 | වධහිංසා පැමිණවීම | 05 |
| 03 | නීති විරෝධී ලෙස රඳවා ගැනීම | 20 |
| 04 | පොලිස් අත්අඩංගුවේ සිටියදී මරණ | 01 |
| | එකතුව | 542 |

II. ඉන් ලියාපදිංචි කළ පැමිණිලි සංඛ්‍යාව - 542
III. විමර්ශනය ආරම්භ කර ඇති පැමිණිලි සංඛ්‍යාව - 542
IV. විමර්ශන අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව - 200
V. නිර්දේශ ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව - 200
VI. ලබා දී ඇති නිර්ධදේශ වල ක්‍රියාත්මක වීම - 200

එල්.පී.චාමිකා සුබෝධිනී
තොරතුරු නිලධාරී
ජාතික පොලිස් කොමිෂන් සභාව

ක්ෂණික ඇමතුම්/உடன் தொடர்பு/Hot Line : **1960 / 0710361010**

දුරකථන අංකය / தொலைபேசி / Telephone No. 0112166500
ෆැක්ස් / தொலைநகல் / Fax 011 2166555
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail info@npc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.npc.gov.lk

| දිනය | පැමිණිලිකරුගේ නමසහ දිස්ත්‍රික්කය | පැමිණිල්ලේ ස්වභාවය | | | | | | පොලිස් කොමිෂන් සභාවෙන් ප්‍රතිචාර ලැබී ඇත්ද යන්න? ඔව්/නැත | පැමිණිල්ල විමර්ශනය වුවාද නැතිද යන්න? | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නීති විරෝධී අත්අඩංගු | රැඳවා තබාගැනීම | වධ හිංසනය | නීති විරෝධී | පොලිසිය විසින් පැමිණිලි විභාග නොකිරීමට එරෙහිව ලැබී ඇති පැමිණිලි | වෙනත් | | | |
| #1 2022/06/19 | එච් එම් රොශාන් (ගම්පහ) | | X | | | | | ඔව් | නැත | |
| #2 2022/08/02 | දීපානි දිල්රුක්ෂි (ගම්පහ) | | | | | X | X | ඔව් | රාගම පොලිසිය විසින් කැඳවීමක් කර නැවත පැමිණිල්ලක් ගොනු කර ඇත | පොලිස් කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන බව දන්වා ඇත |
| #3 2022/09/05 | එම් උපුලි වාසනා (ගම්පහ) | | | | | | X | නැත | නැත | සමථයකට පත්ව ඇත |
| #4 2022/09/12 | ඒ මංජුලා අරුණ කුමාරි (ගම්පහ) | | | | | X | | ඔව් | පොලිස් කොමිසමෙන් සහ මානව හිමිකම් කොමිසමෙන් ජා ඇල පොලිසිය වෙත දැනුම් දී ඇති අතර ජා ඇල පොලිසියෙන් සමත මණ්ඩලයට යොමු කර ඇත | සමථ මණ්ඩලයේදී කරුණු විමසා දණ ගසා වැඳ නැවත මෙවැනි ක්‍රියා නොකරන බවට පොරොන්දු වී ඇත |
| #5 2022/09/12 | පයාගලගේ ලැටිෂියා ප්‍රනාන්දු (ගම්පහ) | | | | | X | | ඔව් | විමර්ශන ආරම්භ කිරීමට කටයුතු කරන බවට NPC/PCID/WP/CO/209 අංකය යටතේ පොලිස් කොමිෂන් සභාව විසින් එවන ලද ලිපියෙහි සඳහන් කර ඇත | බිලූමෙන්ඩල් පොලිසිය විසින් වින්දිතයාසහ චූදිතයා කැඳවා විමර්ශනය කර එම භාණ්ඩ හා මුදල් ලබා දී ඇත |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| #6 2022/09/15 | අංගම්පොඩි සංජය ද සොයිසා (ගම්පහ) | | X | X | | | | ඔව් | පොලිස් කොමිෂන් සභාව විමර්ශන ආරම්භ කර ඇත | සිදුවීමට අදාළ පොලිස් නිලධාරීන් දෙදෙනා හට ස්ථාන මාරුවීම් ලබා දී ඇත |
| #7 2022/10/02 | නිරූපා සුභාෂිණී (ගම්පහ) | | | | | X | | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |
| #8 2022/10/06 | චන්ද්‍රිකා ප්‍රියන්ති (ගම්පහ) | | | | | X | | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |
| #9 2022/10/08 | දෙනුවන් ප්‍රසාද් (ගම්පහ) | | | | | | X | නැත | නැත | නැත |
| #10 2022/10/08 | කේ එම් ඊ ඒ එන් ගුණසේකර (ගම්පහ) | | | | | X | | ඔව් | ඉදිරි ක්‍රියාමාර්ග නැත | මේ වන විට ඔහු වෙනත් නඩුවක වරදකරු වී සිරගත වී ඇත |
| #11 2022/10/11 | සසිඳු මදුරංග (ගම්පහ) | | | | | | X | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |
| #12 2022/12/19 | මාරියා පෙරෙරා (ගම්පහ) | | | | | | X | ඔව් | පොලිස් කොමිෂන් සභාව විසින් ලිපියක් එවා ඇති අතර වින්දිතයන් හට ප්‍රශ්නාවලියක් යොමු කර ඇත. පොලිස් ස්ථානයෙන් ද කොමිෂන් සභාව තොරතුරු විමසා තිබේ. ඊට අනතුරුව පොලිසිය නීතිය ක්‍රියාත්මක කර ඇත. | පොලිසිය විසින් වරදකරු හට නඩු පවරා ඇත |
| #13 2022/12/19 | ලැටිෂියා ප්‍රනාන්දු (ගම්පහ) | | | | | | X | ඔව් | පොලිස් කොමිෂන් සභාව විමර්ශන ආරම්භ කර ඇත | බිලූමෙන්ඩල් පොලිස් ස්ථානයනට ලිඛිත උපදෙස් ලබා දී ඇත |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| #14<br>2022/05/14 | දිනේෂ් ප්‍රියදර්ශන දොඩම්ගොඩ (මාතර) | | | | | | X | ඔව් | පැමිණිල්ලට අදාළව සිදුකරනු ලබන පරීක්ෂණ කටයුතු සඳහා පොලිස් කොමිෂන් සභාව (දකුණු පළාත) විසින් NPC/PCID/SOUMT/16/22 අංකය යටතේ තොරතුරු ඉල්ලා පැමිණිලිකරුට ලිපියක් එවා ඇති අතර 2022/08/25 දිනට පෙර ඊට අදාළ පිළිතුරු එවන ලෙස දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු 2022/08/21 දින අදාළ තොරතුරු දිව්රුම් ප්‍රකාශයක් මඟින් ලබා දී ඇත. | |
| #15<br>2022/07/15 | ගයාන් ෂම්මි චන්ද්‍රදාස (මාතර) | | | X | | | | නැත | නැත | නැත |
| #16<br>2022/07/26 | රොනල්ඩ් ජයවර්ධන (මාතර) | | | | | | X | ඔව් | NPC/PCID/SP/GH/63/2022 අංකය යටතේ විමර්ශනය සිදු කරන ලදී | නඩුව සඳහා තොරතුරු ලබා දී ඇති බවත් එම නඩුව මාර්ගයෙන් විසඳුමක් ලබා ගන්නා ලෙස පවසා දැනුම් දීමක් කර ලිපියක් එවා ඇත |
| #17<br>2022/08/23 | එම් බී නිශාන්ත සමන් කුමාර (මාතර) | | | | | | X | ඔව් | NPC/PCID/SP/GL/77/2022 අංකය යටතේ විමර්ශනයක් සිදු කරන බව දන්වා ඇත | ප්‍රතිචාර නැත |
| #18<br>2022/09/05 | ඒ බී නිසංසලා කුමාරි (මාතර) | | X | X | | | | ඔව් | විමර්ශනයක් සිදු විය | කට උත්තර ලබාගෙන නඩුව සඳහා ඉදිරිපත් කරන බව දැනුම් දෙන ලදී |
| #19<br>2022/09/05 | කේ බී රුක්ශියා සිල්වා (මාතර) | | X | X | | | | ඔව් | විමර්ශනයක් සිදු විය | කට උත්තර ලබාගෙන නඩුව සඳහා ඉදිරිපත් කරන ලදී |
| #20<br>2022/06/01 | ලියනදුරගේ දමයන්ති (ගාල්ල) | | | X | | | | නැත | පැමිල්ල ඉල්ලා අස් කරගන්නා ලදී | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| #21 2022/06/06 | අලවත්තගේ තිලකරත්න (ගාල්ල) | X | | | | | | ඔව් | පැමිණිල්ලට අදාළව සිදුකරනු ලබන පරීක්ෂණ කටයුතු සඳහා පොලිස් කොමිෂන් සභාව (දකුණු පළාත) විසින් තොරතුරු ඉල්ලා පැමිණිලිකරුට ලිපියක් එවා ඇති අතර 2022/05/15 දිනට පෙර ඊට අදාළ පිළිතුරු එවන ලෙස දන්වා ඇත. නමුත් පැමිණිලිකරු විසින් තොරතුරු ඉදිරිපත් කර නොමැත. එනම නිසාවෙන් පො.කො නැවත එම තොරතුරු 2022/05/30 දිනට පෙර එවන ලෙස ඉල්ලා ලිපියක් පැමිණිලිකරුට එවා ඇත. | |
| #22 2022/08/15 | ඩී කේ එස් සුරංගිකා (ගාල්ල) | | | | | | X | ඔව් | NPC/PCID/SP/GL/70/22 අංකය යටතේ විමර්ශනය විය | සාධාරණයක් ඉටු නොවිය |
| #23 2022/09/05 | ඩබ්ලිව් ඒ රූපා නිල්මිණි (ගාල්ල) | | | | | | X | නැත | නැත | නැත |
| #24 2022/05/24 | ඊ එම් චන්ද්‍රාවතී (කුරුණෑගල) | | | | | X | | ඔව් | විමර්ශනය ආරම්භ කර ඇත | විසඳුමක් ලැබී නැත |
| #25 2022/09/02 | ඩී එම් චාමර ලක්මාල් දිසානායක (කුරුණෑගල) | | | | | | X | | | පැමිණිලිකරු ඉදිරිපත් නොවේ |
| #26 2022/10/04 | එම් පී ඩී අමරතුංග (කුරුණෑගල) | | | X | | | | ඔව් | විමර්ශනය ආරම්භ කර ඇත | විසඳුමක් ලැබී නැත |
| #27 2022/12/04 | එස් පී පසිඳු දනංජය (කුරුණෑගල) | | | | | | | ඔව් | විමර්ශනය ආරම්භ කර ඇත | විසඳුමක් ලැබී නැත |
| #28 2022/09/11 | සිරිසේන හෑගොඩ (දෙනියාය) | | X | | | | | ඔව් | NPC/PCID/SP/MT/35/22 අංකය යටතේ විමර්ශනය ආරම්භ කර ඇත | |
| #29 2022/09/13 | දුමින්ද සම්පත් තුසිතා මල්කාන්ති (ත්‍රිකුණාමලය) | | | X | | | | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| #30<br>2022/09/13 | දීපාල් ඉන්ද්‍රජිත්<br>(ත්‍රිකුණාමලය) | | | X | | | | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |
| #31<br>2022/09/13 | රංජිත් ගුණසේකර<br>කේ ජී නිශාන්ති<br>(ත්‍රිකුණාමලය) | | | X | | | | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |
| #32<br>2022/09/13 | එස් ෂන්මුගප්‍රියා<br>චමින්ද විජේකෝන්<br>(ත්‍රිකුණාමලය) | | | X | | | | වින්දිතයන් ගෙන් ප්‍රතිචාරයක් නොමැත | | |
| #33<br>2022/11/03 | එල් ජී වී සී පියදාස<br>(ත්‍රිකුණාමලය) | | | X | | | | නැත | නැත | නැත |
| #34<br>2022/05/12 | ඩබ්ලිව් එම් ශිරාණි<br>ස්වර්ණලතා<br>(මොණරාගල) | | | X | | | X | ඔව් | NPC/PCID/UP/MO/23/2021<br>අංකය යටතේ විමර්ශනය වෙමින්<br>පවතියි | අධිකරණයට කරුණු<br>ඉදිරිපත් කරන ලෙස<br>දන්වා ඇත |
| #35<br>2022/08/23 | ඊ කේ ඉන්ද්‍රා කුමාරි<br>(මොණරාගල) | | X | | | | | ඔව් | NPC/PCID/UP/MO/24/2022<br>අංකය යටතේ විමර්ශනය වෙමින්<br>පවතියි | වින්දිතයාට යම්<br>සහනයක් ලබා දී<br>තිබේ. සති පතා<br>පොලිස් ස්ථානයේ<br>අත්සන් කිරීම නවතා<br>ඇත |
| #36<br>2022/08/25 | උදුලාවතී<br>(මොණරාගල) | X | | X | | | | ඔව් | NPC/PCID/UP/MO/24/2022<br>අංකය යටතේ විමර්ශනය වෙමින්<br>පවතියි | පොලිස් කොමිෂන්<br>සභාව දන්වා ඇත්තේ<br>අධිකරණයට සාක්ෂි<br>ඉදිරිපත් කරන ලෙසය |

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

අංක 56/2, පාලිත පෙදෙස, කොළඹ 09, ශ්‍රී ලංකා.

Tel/Fax: +94 112 669100

Email: right2lifelk@gmail.com

Websites: www.right2lifelanka.org www.aithiya.lk www.dailyreporter.lk www.slcat.org

Facebook pages: Right to Life Sri Lanka | Aithiya | Daily Reporter

Youtube: Aithiya Media